ISSN 1391 - 4006

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT



2021

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
NATIONAL LIBRARY & DOCUMENTATION SERVICES BOARD

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2021

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கள் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2021

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கள் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

ප්‍රකාශනය

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

14, නිදහස් මාවත, කොළඹ 07
14th, Independence Avenue, Colombo 07
இல.14. சுதந்திர வழி, கொழும்பு 07

වාර්ෂික වාර්තාව

2021

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්නා ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර 2021 වසර සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රතිපාදන හා මණ්ඩලයීය ඉපයීම් ද උපයෝගී කර ගනිමින් පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන මෙන්ම ජාතික අවශ්‍යතා සහ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක අතුරින් අංක (04) වන "ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීම" යන්න සාක්ෂාත් කර ගැනීම කෙරෙහි මෙම වසර තුළ වැඩි අවධානයක් යොමු කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට 2021 වසර තුළ එක් එක් අංශ මගින් ඉටු කරනු ලැබූ කාර්යයන්වල ප්‍රගතිය, වසරේ මූල්‍ය ප්‍රගතිය මෙන්ම තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් වේ. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා, ගරු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ට ද මගේ කෘතඥතාව පළ කරමි.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙරට පුස්තකාල පද්ධතියේ ප්‍රමුඛ ආයතනය වන අතර මණ්ඩලය ආරම්භ කර 2021 වසරට වසර පනස් එකක් (51) සපිරේ. ගතවූ අඩ සියවසකට වැඩි කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයන් පිළිබඳව මම සතුටු වෙමි. මෙම වාර්තාව මගින් අප ආයතනයේ ජයග්‍රහණ, අභියෝග සහ වසර පුරාවට එක් එක් අංශ විසින් ළඟා කරගත් කාර්යසාධනය පිළිඹිඹු වේ. මෙරට පුස්තකාල පද්ධතියේ සෙසු පුස්තකාලවල මව් ආයතනය වශයෙන් කටයුතු කරමින් පුස්තකාල වෘත්තිකයන් වෙනුවෙන් නායකත්වය සැපයීම, දැනුම සුරැකීම, සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සහ සියලු දෙනාට තොරතුරු වෙත ප්‍රවේශය ලබාදීමේ කාර්යයන් රැසක් සපුරාලීමට 2021 වසර තුළ කටයුතු කර තිබේ. පවතින වසංගත තත්වය මගින් ගෝලීය වශයෙන් එල්ල වන අභියෝග නොතකා මහජනතාවට සේවය කිරීමට සහ ජාතියේ බුද්ධිමය වර්ධනයට සහාය වීමට මග පෙන්වීම ලබාදුන් මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, උපදේශක කමිටුවල සාමාජික මහත්ම මහත්මීන්ටත් මෙම වාර්තාව සම්පාදනය කළ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පිරිනමමි.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්

පටුන

පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ	01-04
පරිච්ඡේදය 02 -	අංශවල කාර්යභාරය හා ප්‍රගතිය	05-22
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	23-50
පරිච්ඡේදය 04 -	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	51-53
පරිච්ඡේදය 05 -	මානව සම්පත් පැතිකඩ	54

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම.

(ආ) ජාතික මට්ටමේ පුස්තකාල සේවා හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන් ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම, පුස්තකාල වැඩිදියුණු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල සම්පත් ලබාදීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල ආරම්භ කිරීම සඳහා සහයෝගය ලබා දීම, පොත්පත් සංරක්ෂණය සඳහා පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, පළාත් සභා මට්ටමින් පුස්තකාල නගා සිටුවීම සඳහා පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමඟ කටයුතු කිරීම, විවිධ ව්‍යසනවලින් හානි වූ පුස්තකාල සංවර්ධනය, පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම, පුස්තකාල සහයෝගිතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම, ජාතික පුස්තකාලයේ තොරතුරු ඩිජිටල්කරණය කිරීම හා එම තොරතුරු ඇසුරින් ජාතික ඩිජිටල් පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ

දැක්ම :
සමස්ත ජනතාවට පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවේශයක් සපයන ජාතික ඥාන කේන්ද්‍රය බවට පත්වීම

මෙහෙවර :
දැනුවත් සමාජයක් බිහි කිරීම උදෙසා ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම, ජාතික පුස්තකාල හා විඥාපන සේවා පද්ධතිය සංවර්ධනය, පුස්තකාල සේවා කාර්යක්ෂමතාව පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතයට දිරිදීම, ග්‍රන්ථ විඥාපන පහසුකම් සැපයීම සහ ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අනුග්‍රහ දැක්වීම.

අරමුණු හා පරමාර්ථ :

- ශ්‍රී ලංකාවේ පුස්තකාල, තොරතුරු හා තදනුබද්ධ සියලුම සේවා සඳහා නායකත්වය සැපයීම.
- රටතුළ හෝ ඉන් බැහැර ව ලිඛිත, මුද්‍රිත හෝ අන්‍යාකාරයෙන් ප්‍රකාශිත පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ පරිපූර්ණ ජාතික සංචිතයක් පිහිටුවීම.
- ග්‍රන්ථ විඥාපන, ප්‍රලේඛන සේවා සංස්ථාපනය හා පවත්වාගෙන යාම.
- පුස්තකාල හා තොරතුරු සේවා සම්බන්ධ අධ්‍යාපන පුහුණු හා වෘත්තීය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම හා ප්‍රමිති සම්පාදනය.
- දේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මානව සම්පත් සංවිධානය හා භෞතික සම්පත් ප්‍රවර්ධනය.
- දේශීය ග්‍රන්ථ ප්‍රකාශනයට දිරි දීම සහ කියවීම ප්‍රවර්ධනය.
- පුස්තකාල හා තොරතුරු සේවාවන්හි තොරතුරු තාක්ෂණය භාවිතය දිරිමත් කිරීම.
- පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් පවත්නා ආයතන හා සංවිධාන සමඟ සහයෝගීතා වර්ධනය.
- විවිධ ජන කොටස්වල සංස්කෘතික අනන්‍යතාවලට ගරු කරමින් අන්‍යොන්‍ය සහජීවනය තහවුරු කෙරෙන පරිදි පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානය කිරීම.
- ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය සම්පත්, සේවා සංවිධානය හා සැපයීම.

(1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 25වන වගන්තිය ප්‍රකාර සැකසුණි)

1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 3 වැනි වගන්තිය (ආ) ප්‍රකාර ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය 2021.12.31 දින වන විට පහත සඳහන් පරිදි විය.

01. සොනාල ගුණවර්ධන මහතා - සභාපති

සාමාජිකයන් - නිල බලයෙන්

02. මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා මහතා -ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) වෙනුවට (2021 ජනවාරි මස සිට පෙබරවාරි මස දක්වා) එල්. එම්. ඩී. ධර්මසේන මහතා - අතිරේක ලේකම් (පාසල් කටයුතු), (2021 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා)

03. එන්. යූ. එන්. මෙන්ඩිස් මහතා - අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය)

04. අනෝජා පී. ගුරුගේ මහත්මිය .- අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය)

05. ආචාර්ය රුවන් ගමගේ මහතා -. සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා) ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා - සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා)

06. මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා .- සභාපති (ජාතික විද්‍යා පදනම)

07. ඩී. එච්. ආර්. ඩී. විජේසිංහ මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් අමාත්‍යාංශය)

08. මහින්ද බී. හේරත් මහතා - ප්‍රධාන විධායක නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය)

අනෙකුත් සාමාජිකයින්

09. ආචාර්ය ඒ. ඩබ්. ඒ. ප්‍රියංවදා ලක්මාලි වනිගසූරිය මහත්මිය

10. මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය

11. ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ මහතා

12. රාමසාමි සිවරාජා මහතා

13. එච්. ඩී. ප්‍රේමසිරි මහතා


COVID - 19 වසංගත රෝග තත්වය හේතුවෙන් සංචරණ සීමා හා නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම මත 2021 වර්ෂය තුළ ශාලාගතව රැස්වීම් 03ක් සහ මාර්ගගතව 06ක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09ක් පවත්වා තිබේ.

1.4 උපදේශක කමිටු

ආයතනයේ එක් එක් අංශවලින් ඉටුකරනු ලබන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් උපදේශක කමිටු එකොළහක් ස්ථාපිත කර ඇත. පත්කරන ලදී උපදේශක කමිටු මෙම වසර තුළ දී පහත සඳහන් පරිදි රැස්වී තිබේ.

උපදේශක කමිටුව	අංශය	රැස්වීම් පැවත් වූ දිනය
ජාතික පුස්තකාල උපදේශක කමිටුව	පාඨක සේවා හා ප්‍රතිග්‍රහණ	2021.02.18, 2021.05.24, 2021.11.08
ග්‍රන්ථ විඥාපන පාලන උපදේශක කමිටුව	ග්‍රන්ථ විඥාපන පාලන	2021.03.04, 2021.12.01
තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් පුස්තකාල උපදේශක කමිටුව	ඩිජිටල් පුස්තකාල ඒකකය	2021.06.11, 2021.06.25 2021.08.02, 2021.10.05
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන උපදේශක කමිටුව	සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන	2021.03.26
ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන	ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන	2021.02.18, 2021.04.05, 2021.07.13, 2021.12.31
මුද්‍රණ උපදේශක කමිටුව		2021.11.26, 2021.12.14
නව ප්‍රකාශන මිල දී ගැනීමේ උපදේශක කමිටුව		2021.02.02, 2021.07.22
ළමා හා යොවුන් සාහිත්‍ය උපදේශක කමිටුව		2021.01.27, 2021.11.17
පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ උපදේශක කමිටුව	පුස්තකාල සහයෝගිතා	2021.02.16, 2021.11.25
විගණන හා කළමනාකරණ කමිටුව	අභ්‍යන්තර විගණන	2021.03.22, 2021.12.09

1.4 සංවිධාන සටහන



පරිච්ඡේදය 02

අංශවල කාර්යභාරය හා ප්‍රගතිය

2.1 ප්‍රතිග්‍රහණ අංශය

ප්‍රතිග්‍රහණ අංශයේ වගකීම හා කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සුදුසු පොත්පත්, විද්‍යුත් මාධ්‍ය මූලාශ්‍ර සහ වෙනත් වර්ගවල තොරතුරු මූලාශ්‍ර අත්පත් කර ගැනීමයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අනුව (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන, (ii) ශ්‍රී ලංකාව පිළිබඳ විදේශ රටවල පළවන ප්‍රකාශන, (iii) ශ්‍රී ලාංකිකයින් විසින් විදේශ රටවල පළ කරන ප්‍රකාශන (iv) ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ (v) වෙනත් පුස්තකාලවලට ලබාගත නොහැකි එහෙත් පර්යේෂණ සඳහා අත්‍යවශ්‍ය විමර්ශන මූලාශ්‍ර සහ (vi) පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන අත්පත් කර ගැනීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ. මීට අමතරව ISBN, ISSN හා ISMN අංක ලබාදෙන ප්‍රකාශන තැන්පතු පිටපත් සේ ලබා ගැනෙයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කිරීමේ දී ප්‍රධාන ක්‍රම 04ක් අනුගමනය කරනු ලැබේ.

(i) නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම

(ii) මිල දී ගැනීම්

(iii) පරිත්‍යාග

(iv) හුවමාරු සේවා ක්‍රම (Exchange Services) යටතේ ප්‍රකාශන ලබාගැනීම

එක් එක් ප්‍රතිග්‍රහණ ක්‍රමය යටතේ අත්පත් කර ගත් ප්‍රකශන සංඛ්‍යාව පහත පරිදි වේ.

අනු අංකය	ප්‍රතිග්‍රහණය ක්‍රමය	ප්‍රතිග්‍රහණය කළ ප්‍රකාශන සංඛ්‍යාව
(i)	නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම	5846
(ii)	මිල දී ගැනීම්	392
(iii)	පරිත්‍යාග පුද්ගල/ආයතන/ISBN	297
(iv)	හුවමාරු සේවා ක්‍රම (Exchange Services) යටතේ ප්‍රකාශන ලබාගැනීම	125

2021 වර්ෂය තුළ දී Delnet හා Law Lanka දත්ත පදනම්වල වාර්ෂික දායකත්වය ඇතුළුව පුස්තකාල තොරතුරු මූලාශ්‍ර 392 ක් මිල දී ගැනීම වෙනුවෙන් රු.1,438,042.00ක මුදලක් වැය කර තිබේ.

Koha පුස්තකාල මෘදුකාංගය මඟින් ප්‍රතිග්‍රහණ කටයුතු සිදු කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සූචිකරණ කටයුතු සඳහා Koha පුස්තකාල මෘදුකාංගය භාවිත කරනු ලබන අතර මෙම වර්ෂය තුළ Koha පරිගණක මෘදුකාංගය භාවිතයෙන් පරිගණක සූචිය සඳහා ප්‍රකාශන 4148ක් ඇතුළත් කර තිබේ. මීට අමතරව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු Koha දත්ත පදනම ඇසුරින් ලබා ගැනීමට උපයෝගී වන පරිග්‍රහණ ලේඛන 2020 වසරේ ජූලි-දෙසැම්බර් කලාප සහ 2021 පෙබරවාරි කලාපය දක්වා සම්පාදන කටයුතු නිම කොට තිබේ.

පරිග්‍රහණ කටයුතු සඳහා RFID - Tag ක්‍රමය භාවිතයට ගැනීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පොතපත ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් මෙන් ම සංගණන කටයුතු පහසු කර ගැනීම සඳහා RFID - Tag ක්‍රමය හඳුන්වා දී තිබෙන අතර මෙම වර්ෂය තුළ ප්‍රකාශන 2982ක් සඳහා RFID -Tag ඇතුළත් කර තිබේ.

2.2 පාඨක සේවා අංශය

ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති පොත්පත් සහ අනෙකුත් තොරතුරු මූලාශ පරිශීලනය කිරීමට පාඨකයින්ට අවස්ථාව සලසා දීම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. COVID-19 වසංගත තත්වය හමුවේ වුව ද පසුගිය වසරට සාපේක්ෂව උපරිම අයුරින් මාර්ගගතව හා භෞතික වශයෙන් මෙම වසරේ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය මඟින් සේවය සපයා තිබේ. පාඨක අවශ්‍යතා සඳහා මහල් තුනක ප්‍රධාන කියවීම් ශාලා තුනක් ද, බිම් මහලේ විශේෂ තොරතුරු කවුන්ටරයක් ද (Information Counter) පාඨක සේවා අංශය තුළ පවත්වාගෙන යනු ලැබේ.

පාඨක ලියාපදිංචිය

මෙම වසරේ දී පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගෙන ඇති අතර ඒ වෙනුවෙන් ලැබී ඇති ආදායම රු. 241,150.00කි

සාමාජික කාණ්ඩය		සාමාජික සංඛ්‍යාව
යාවජීව සාමාජිකත්වය	-	70
වාර්ෂික සාමාජිකත්වය	-	128
ත්‍රෛමාසික සාමාජිකත්වය	-	160
නොමිලේ (කියවීමේ මාසය වෙනුවෙන්)	-	87
දෛනික සාමාජිකත්වය	-	1757

විමර්ශන සේවා හා තොරතුරු සැපයීමේ සේවාව

මෙම වසර තුළ ජාතික පුස්තකාලයේ විවිධ තොරතුරු මූලාශ්‍ර මඟින් පාඨකයින් සඳහා විමර්ශන සේවා (Reference Services) හා තොරතුරු සේවා (Information Services) සපයා තිබේ. ඒ අනුව මෙම වසර තුළ ජාතික පුස්තකාලය පරිහරණය කළ පර්යේෂකයින් ඇතුළු පාඨක සංඛ්‍යාව 3036 ක් වන අතර පාඨක පරිශීලනය සඳහා 2021 වසරේ මූලාශ්‍ර 107,809ක් ලබා දී තිබේ. තව ද විමසීම් සේවාව යටතේ පාඨකයින් 2329ක් වෙනුවෙන් තොරතුරු ලබා දී ඇත.

ප්‍රතිරූපන පිටපත් සේවය

ජාතික පුස්තකාලයේ විවිධ එකතුවල අන්තර්ගත තොරතුරු ප්‍රතිරූපන පිටපත් ක්‍රමය යටතේ පාඨකයින්ට ලබාගැනීමට පහසුකම් සලසා තිබේ. මෙම වසරේ මෙලෙස පිටපත් ලබාදීම මඟින් රු.811,858.75ක ආදායමක් උපයාගෙන තිබේ.

පාඨක අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම

ජාතික පුස්තකාලය එහි සම්පත් හා සේවා පිළිබඳ ජනතාව සහ ආයතන, විවිධ සංවිධාන දැනුවත් කිරීමේ අරමුණින් ආසියානු පදනම හා ජාතික පුස්තකාලය එක්ව Meet an Expert වැඩසටහනේ වැඩසටහන් 7 ක් හා Let's Read වැඩසටහනේ වැඩසටහන් 5 ක් (Zoom හා ජාතික පුස්තකාල Facebook පිටුව හරහා) පවත්වන ලදී.

අන්තර් පුස්තකාල පිරුළු සේවාව

අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ මෙම වසර තුළ ප්‍රධාන පුස්තකාල කිහිපයක් සමඟ මෙම සේවාව පවත්වාගෙන ගොස් තිබේ. ඒ අනුව 2021 වසරේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රකාශන 04ක්, සෞන්දර්ය විශ්වවිද්‍යාලය වෙත ප්‍රකාශන 03ක් හා කොළඹ මහජන පුස්තකාලය වෙත ප්‍රකාශන 04ක් මෙම සේවාව යටතේ ලබා දී තිබේ.

ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා එහි සේවාවන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණෙන් ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය පිහිටුවා ගෙන තිබෙන අතර එහි 2020/2021 හි 06 වන සැසිවාරයේ තුන්වන කමිටු රැස්වීම 2021.03.31 දින පවත්වන ලදී. මෙම සංවිධානය විසින් මාසිකව සංවිධානය කෙරෙන මාසික සිනමා දක්ම යටතේ “The Boy who harnessed the wind" යන චිත්‍රපටය ප්‍රදර්ශනය කොට තිබේ.

2.3 තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සේවා සහ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ තොරතුරු තාක්ෂණය යොදාගැනීම හා සම්බන්ධ කටයුතුවල මෙන් ම මෙම ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ උපදේශක සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඊට අමතරව ජාතික ඩිජිටල් පුස්තකාලයේ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම, දැනුම වර්ධනය උදෙසා ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම ඇතුළු ක්ෂේත්‍රයට අදාළ මෘදුකාංග සංවර්ධනය කිරීම මෙම අංශය යටතේ සිදු වේ.

ජාතික පුස්තකාලයේ වෙබ් සර්වරය (web server) හා මේල් සර්වරය (mail server) පවත්වාගෙන යාම.

ආයතනයේ Web සහ Mail server පවත්වාගෙන යාම සහ පරිගණක දත්ත පදනම් පවත්වාගෙන යාම, පවත්නා දත්ත පදනම් යාවත්කාලීන කිරීම මෙන්ම ගැටලු නිරාකරණය කිරීම සිදු කර තිබේ.

මණ්ඩලයීය Facebook පිටුව හා නිවහන් පිටුව යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් හා සේවා පිළිබඳ අවබෝධය වැඩි ග්‍රාහක පිරිසක් වෙත සන්නිවේදනය කිරීමේ අරමුණෙන් මණ්ඩලයීය Facebook පිටුව හා නිවහන් පිටුව (www.natlib.lk) පවත්වාගෙන යන අතර මේ මඟින් දුරස්ථව ජාතික පුස්තකාල සේවා සඳහා ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව සලසා දී තිබේ. මේ අනුව පර්යේෂණ වැඩමුළු සම්බන්ධ තොරතුරු, මණ්ඩලයේ 50 වන සංවත්සරයට අදාළ සමරු කලාපය වෙබ් අඩවියට ඇතුළත් කිරීම සහ ආසියානු පදනමේ Let's Read නම් ව්‍යාපෘතියට හා Global Academic Research Institute (GARI) ආයතනයේ පර්යේෂණ පත්‍රිකා ජාතික ඩිජිටල් පුස්තකාල එකතුවට ප්‍රවිශ්ඨ කිරීම සඳහා ජාතික පුස්තකාල වෙබ් පිටුව හරහා පිවිසුම ලබාදීමට කටයුතු කර තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා YouTube නාලිකාව පවත්වාගෙන යාම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සම්බන්ධයෙන් සකස් කරන කෙටි ප්‍රචාරාත්මක වීඩියෝපට අන්තර්ජාලය ඔස්සේ විකාශනය කිරීම සඳහා මණ්ඩලය වෙනුවෙන් YouTube නාලිකාවක් පවතවාගෙන යනු ලැබේ.

2.4 ග්‍රන්ථ විඥාපන පාලන අංශය

ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික වශයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය, සාධිකාරී ලේඛන සම්පාදනය හා විශේෂ ග්‍රන්ථ නාමාවලි හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන ව්‍යාපෘති වැඩිදියුණු කොට පවත්වාගෙන යාම මූලික වේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම ජාතික පුස්තකාලය සතු ප්‍රධාන වගකීමකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු රට තුළ පළවන සියලු ම ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් සාධිකාරී ප්‍රකාශනයකි. මෙම කාර්යය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1974 වර්ෂයේ සිට ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2020 මාර්තු කලාපයේ සිට අගෝස්තු දක්වා කලාප 06ක් සම්පාදනය හා 2021 ජනවාරි සිට මාර්තු කලාපයේ සිංහල/දෙමළ/ඉංග්‍රීසි තැන්පතු පිටපත් සඳහා ඩිවි දශම වර්ග අංක යෙදීම, කොංග්‍රස් විෂය ශීර්ෂ ග්‍රන්ථවලට යෙදීම හා Koha දත්ත පදනමට ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කිරීම ආරම්භ කර තිබේ. ප්‍රකාශිත සියලුම ජාතික ග්‍රන්ථ නාමාවලිවල අඩංගු තොරතුරු ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library) වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකිය. (www.natlib.lk).

ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වාර සඟරාවල ඇතුළත් ලිපි පිළිබඳ තොරතුරු පාඨකයන් හට පහසුවෙන් සොයාගැනීම සඳහා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ. මෙය ත්‍රෛමාසික ප්‍රකාශනයක් වන අතර 2019/04 කලාපයේ සිට 2020/3 කලාපය දක්වා කලාප 04ක සම්පාදන කටයුතු නිමකර ඇත. මෙම තොරතුරු ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library) වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකිය. (www.natlib.lk)

ජාතික පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍ර සූචිගත කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අත්පත්කර ගනු ලබන පුස්තකාල සම්පත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කොට Koha පුස්තකාල පරිගණක මෘදුකාංගය ඇසුරෙන් පරිගණකගත සූචිය සකස් කිරීමත්, ජාතික පුස්තකාල සූචිය පවත්වාගෙන යාමත් මෙම අංශයේ තවත් ප්‍රධාන කාර්යයක් වේ. මෙහි දී ජාතික පුස්තකාලය අත්පත් කරගන්නා සියලුම පුස්තකාල සම්පත් අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුව සූචිගත කිරීම, වර්ග කිරීම හා කොන්ග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ යෙදීම මෙන් ම පරිගණකගත කිරීමේ කටයුතු ද සිදු වේ. 2021 වර්ෂය තුළ තොරතුරු මූලාශ්‍ර 3896ක් හා වාර සඟරා ලිපි 675ක් Koha දත්ත පදනමට ඇතුළත් කර තිබේ.

ප්‍රකාශනගත සූචිකරණ දත්ත - **Cataloguing in Publication Data (CIP)**

දිවයිනේ පුස්තකාලවල සූචිකරණය හා වර්ගීකරණ කටයුතුවල සමරූපි බවක් ඇති කිරීම සඳහා කිසියම් ප්‍රකාශනයකට අදාළ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එම කෘතියෙහි ම මුද්‍රණය කිරීම මෙමගින් සිදු වේ. ඒ අනුව 2021 වර්ෂයේ දී කර්තෘවරු හා ප්‍රකාශකයින් විසින් කෘති 172ක් (සිංහල 106ක්, දෙමළ17ක් හා ඉංග්‍රීසි 49ක් වශයෙන්) සඳහා ප්‍රකාශනගත සූචිකරණ දත්ත ලබාගෙන තිබේ.

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු යොදා තිබේ. මේ සඳහා හඳුන්වා දී ඇති ශීඝ්‍ර සූචිකරණ ආකෘතිය සම්බන්ධයෙන් අදාළ විද්වත් කමිටු රැස්වීම් 03ක් Zoom ඔස්සේ පවත්වා තිබේ. ඒ අනුව එහි සංස්කරණ කටයුතු අවසන් කිරීම හා පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතියට අනුව සකස් කරන ලද විස්තරාත්මක සූචිකරණ රාමුව පිළිබඳව පුස්තකාලයාධිපතිවරු දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වා තිබේ.

2.5 සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

ජාතික පුස්තකාල එකතුවට අයත් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙන් ම දිවයිනේ වෙනත් පුස්තකාලවල එකතු සංරක්ෂණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම මෙම අංශයේ කාර්යභාරය වේ. මේ යටතේ ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම, ධූමායනය, පොත් බැඳීම, අලුත්වැඩියා කිරීම හා ජාතික පුස්තකාල එකතුව සහිත ප්‍රදේශයේ වායුසමනය කිරීම, ආර්ද්‍රතා පාලනමාන සවි කිරීම මඟින් නිසි තෙතමනය (humidity) ආරක්ෂා කිරීමටත් කටයුතු කරනු ලැබේ. මීට අමතරව ජාතික මට්ටමේ පුස්තකාල සංරක්ෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය උපදේශක දායකත්වය ලබා දීම සිදු වේ. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහන (MOW) සහ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහන (ICH) මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

පොත් බැඳුම් හල

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කර බැඳුම් කටයුතු කිරීම පොත් බැඳුම්හලේ ප්‍රධාන කාර්යභාරය වේ. මේ යටතේ ජාතික එකතුවේ පොත් 410ක් සහ ගැසට් පත්‍ර 174ක්, චක්‍රලේඛ 09ක් බැඳීම හා සංවෘත පුස්තිකා පෙට්ටි 70ක් සකස් කිරීම සිදු කරන ලදී.

ධූමායනය

පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීමේ එක් ක්‍රමවේදයක් ලෙස ඒ සඳහා හඳුනාගත් පොතපත ධූමායනයට ලක් කිරීම සිදු කරනු ලැබේ. මේ යටතේ මෙම වසර තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සතු පොත් 465ක්, චක්‍රලේඛ 12ක් හා ගැසට් පත්‍ර 169ක් තයිමෝල් ධූමායනය හා පොත් 653ක් පොස්පීන් ධූමායනය කිරීම මගින් සංරක්ෂණය කර ඇත.

ලෝකයේ මතකය සුරැකීම පිළිබඳ වැඩසටහන (MOW) හා අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමේ වැඩසටහන (ICH)

යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හා ශ්‍රී ලංකාවේ අස්පර්ශණීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ජාතික නාභිගත මධ්‍යස්ථානය (Focal Point) ලෙස කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. මේ යටතේ ශ්‍රී ලංකාවට උරුම පැරණිතම ලේඛනයක් ලෙස සැලකෙන මහාවංශය පුස්කොළ පොත පිළිබඳ නාම යෝජනා පත්‍රයක් සහ ඊට අදාළ වාර්තා සකස් කොට යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහනට ඇතුළත් කිරීමට සලකා බැලීම සඳහා යොමු කිරීමට පියවර ගෙන තිබේ.

මෙම වැඩසටහන යටතේ මෙරට සාම්ප්‍රදායික කලාංගයක් වන "දුම්බර රටා කලාල" සම්ප්‍රදාය

සම්බන්ධ නාම යෝජනා පත්‍රය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා එක්ව සකස් කර 2020 වසරේ දී යුනෙස්කෝ සංවිධානය වෙත යොමු කරන ලදී. මේ අනුව 2021 දෙසැම්බර් මස 13 දින සිට 16 දින දක්වා ප්‍රංශයේ යුනෙස්කෝ මූලස්ථානයේ පැවති අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීමේ 16 වැනි අන්තර් රාජ්‍ය සමුළුවේ දී ශ්‍රී ලංකාව මගින් ඉදිරිපත් කරන ලද දුම්බර රටා කලාල සම්ප්‍රදාය යුනෙස්කෝ අස්පර්ශනීය සංස්කෘතිය පිළිබඳ මානව සංහතියේ නියෝජිත නාම ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. මේ මගින් මෙරට සම්ප්‍රදායික කලාංගයක් වන දුම්බර පැදුරු ආශ්‍රිත දුම්බර රටා කලාල සම්ප්‍රදාය ලෝක උරුමයක් ලෙස තහවුරු වී තිබේ.

සංරක්ෂණ කටයුතු පිළිබඳ උපදෙස් සැපයීම හා ප්‍රමිති සම්පාදනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පොත් එකතුවේ ආරක්ෂාවට අවශ්‍ය සංරක්ෂණ උපදෙස් සැපයීමට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලට අයත් පුස්තකාලවල මතුවන සංරක්ෂණ ගැටලු සම්බන්ධයෙන් අවස්ථානුකූලව උපදෙස් ලබාදීම සිදුවේ.

- COVID-19 වසංගතය හමුවේ මහජන පුස්තකාල පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අරිසෙන් අහුබුදු පදනමේ පොත් සංරක්ෂණයට උපදෙස් ලබා දීම.
- ආචාර්ය ගාමිණී කොරයා පදනමේ පොත් සංරක්ෂණයට උපදෙස් ලබා දීම.
- COVID-19 සම්ප්‍රේෂණය පාලනය කරමින් මහජන පුස්තකාල නැවත විවෘත කිරීම සම්බන්ධයෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පෝස්ටරයක් නිර්මාණය කර ජාතික පුස්තකාල මුහුණු පොතට හා වෙබ් පිටුවට ඇතුළත් කිරීම.

2.6 පුස්තකාල පර්යේෂණ අංශය

පළාත් මට්ටමින් පුස්තකාල සමීක්ෂණ කටයුතු සිදු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු රැස් කිරීම, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ තෝරාගත් මාතෘකා පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, පර්යේෂණ වැඩමුළු පැවැත්වීම සහ පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙම අංශයේ මුඛ්‍ය කාර්යභාරය වේ.

පර්යේෂණ ක්‍රමවේදයාව පිළිබඳව වැඩමුළු පැවැත්වීම

පර්යේෂණ ක්‍රමවේදයාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන විශ්වවිද්‍යාලවල උපාධි හදාරණ විද්‍යාර්ථීන් හා ඒ පිළිබඳ අවශ්‍යතා සහිත විද්‍යාර්ථීන් වෙනුවෙන් මෙම වැඩමුළු සංවිධානය කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් සිදු කෙරේ. මෙහි දී පර්යේෂණවල දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම වෙනුවෙන් පවත්නා SPSS මෘදුකාංගය භාවිතය සම්බන්ධයෙන් ද වැඩමුළු 03ක් 2021 වසරේ දී පවත්වා ඇත.

වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය **(Annual Research Symposium)** පැවැත්වීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වාර්ෂිකව සංවිධානය කරනු ලබන පර්යේෂණ සම්මන්ත්‍රණය 2021 වසරේදී ද "Libraries for a Better World: Achieving Sustainable Development Goals" යන තේමාව යටතේ සංවිධානය කිරීම. මෙම සම්මන්ත්‍රණය COVID – 19 වසංගතයෙන් හේතුවෙන් මාර්ගගතව පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ලැබීය.

2.7 ඩිජිටල් පුස්තකාල ඒකකය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ඩිජිටල් පුස්තකාල කටයුතු පවත්වාගෙන යාමේ අරමුණෙන් 2016 වසරේ සිට ඩිජිටල් පුස්තකාල ඒකකය ස්ථාපිත කර තිබෙන අතර එය තොරතුරු තාක්ෂණ හා පාඨක සේවා යන අංශවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙම ඩිජිටල් පුස්තකාල ඒකකය මගින් ඩිජිටල්කරණය සඳහා තොරතුරු සම්පත් හඳුනා ගැනීම, ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා දැනට එක්රැස් කර ඇති තොරතුරු DSpace දත්ත පදනමට ප්‍රවේශ කිරීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සුදුසු ඩිජිටල් ප්‍රකාශන හා තොරතුරු ඒකරාශි කිරීම, පාඨකයින් සඳහා ඩිජිටල් තොරතුරු සේවා සැපයීම, ආදී කටයුතු මෙම ඒකකයෙන් සිදු කෙරේ.

ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන ලබා ගැනීම සඳහා ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් සකස් කිරීමට කටයුතු කර තිබේ. ඒ යටතේ ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන harvest කිරීම සම්බන්ධ ප්‍රතිපත්තියෙහි කෙටුම්පත උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා එහි සංශෝධන කමිටු සාමාජිකයන්ගෙන් ලබා ගැනීමට පියවර ගෙන තිබේ.

ජාතික පුස්තකාල එකතුව ඩිජිටල්කරණය කිරීම

ජාතික ඩිජිටල් පුස්තකාලයට ඩිජිටල් සම්පත් විවිධ මූලාශ්‍ර ඔස්සේ හඳුනාගැනීම මේ යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පැරණි ගැසට් එකතුවෙන් 1958 වසරේ සිට 1962 වසර දක්වා ප්‍රකාශිත රජයේ ගැසට් පත් 6271ක් ඇසුරින් සංඛ්‍යාංකකරණය කරන ලදී තොරතුරු Dspace දත්ත පදනමට ප්‍රවේශ කිරීම, විද්‍යුත් පුවත් පත් 891ක්, මණ්ඩලයීය ප්‍රකාශන 16ක් හා වෙනත් ප්‍රකාශන 593ක් ඩිජිටල් පුස්තකාලයට එකතු කිරීමට පියවර ගෙන තිබේ.

වෙනත්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රවර්ධනය කිරීම සඳහා රුහුණු විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති නිමල් හෙට්ටිආරච්චි මහතා විසින් "**Automation Digitization and Networking of Libraries in Sri lanka"** යන තේමාව යටතේ සහ ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන තොරතුරු නිලධාරී මනුජ කරුණාරත්න මහතා විසින් ඩිජිටල් පුස්තකාල සේවා භාවිතය සහ සංවර්ධනය යන තේමාව යටතේ Zoom ඔස්සේ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ මෙන්ම ලොව විවිධ රටවල පර්යේෂණ වැඩමුළු සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකාව හා සම්බන්ධ ආයතනයක් වන Global Academic Research Institute (GARI) සහ The Asia Foundation යන ආයතන සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබෙන අතර එහිදී ගත් තීරණයක් අනුව මෙම ආයතන මගින් ප්‍රකාශයට පත් කරනු ලබන විද්‍යුත් මූලාශ්‍ර ජාතික ඩිජිටල් පුස්තකාල එකතුවට සම්බන්ධ කිරීම 2021.02.17 දින ගරු අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමාගේ සහභාගිත්වයෙන් ජනගත කරන ලදී.

2.8 ව්‍යාප්ති සේවා අංශය

මෙම අංශය මගින් රට තුළ විසිරී පවත්නා විවිධ වර්ගයේ පුස්තකාල සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වීම, උපදේශක සේවා සැපයීම, කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරු දිරිමත් කිරීම, ජාතික කියවීමේ මාසයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල සඳහා පොත් ආධාර ලබා දීම හා පුස්තකාල සංවර්ධනය කිරීම, ජාතික හා ප්‍රාදේශීය

මට්ටමේ පොත් ප්‍රදර්ශන හා අධ්‍යාපන ප්‍රදර්ශන සංවිධානය කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, ඩිජිටල් පුස්තකාල සංවර්ධනය, පුස්තකාල සඳහා පොත් නිර්දේශ කිරීම, වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික කියවීමේ මාසය වැඩසටහන

ශ්‍රී ලාංකීය ප්‍රජාව අතර පොතපත කියම ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් සෑම වසරකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය වශයෙන් රජය මගින් ප්‍රකාශයට පත් කර තිබේ. මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහනේ තේමාව වශයෙන් ''දුරස්ථ නොවන කියවීම'' යන්න තෝරා ගෙන තිබේ. ජාතික කියවීමේ මාසයේ වැඩසටහන් වලට සමගාමීව (2019) වර්ෂයට අනුව ප්‍රශස්ත මට්ටමේ වැඩසටහන් සංවිධානය කළ පුස්තකාල 144ක් ඇගයීමට ලක් කළ අතර මෙම පුස්තකාල අතුරෙන් ප්‍රථම ස්ථානය චුන්නාකම් මහජන පුස්තකාලයටත් දෙවන ස්ථානය හැඳල මහජන පුස්තකාලයටත් හිමි විය. තෙවන ස්ථානය අලවෙඩ්ඩි මහජන පුස්තකාලයටත් හිමි විය. ජයග්‍රාහී පුස්තකාලය සඳහා සම්මාන සහ සහතිකපත් ප්‍රදානය 2021 දෙසැම්බර් මස 29 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය සුරේන් රාඝවන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මීට අමතරව ජාතික කියවීමේ මාසය 2021 වැඩසටහනට සමගාමීව ශ්‍රී ලාංකීය ප්‍රජාව අතර කියවීමේ රුචිය වර්ධනය කිරීම සහ සාහිත්‍ය රසවින්දනය පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණින් zoom ඔස්සේ මාර්ගගතව (online) සම්මන්ත්‍රණ මාලා 10ක් සංවිධානය කිරීමට කටයුතු කරන ලදී.

දිනය	දේශක	මාතෘකාව	සහභාගීත්වය
2021.10.01	සම්මානි විජේසිංහ	ළමා සාහිත්‍ය රසවින්දනය	210
2021.10.06	ආචාර්ය ප්‍රියංවදා වනිග සූරිය	ශ්‍රී ලාංකේය පාඨකයා හා මාර්ගගත කියවීම	184
2021.10.08	මහාචාර්ය රෝහිණී පරණවිතාන	වර්තමාන පොදු පාඨකයා හා සම්භාව්‍ය සාහිත්‍ය කියවීම	75
2021.10.12	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ	නූතන කවිය රසවිඳීම හා පාඨකයා	191
2021.10.15	ප්‍රවීණ ලේඛක ජයතිලක කම්මැල්ලවීර	කෙටිකතා රසවින්දනය	175
2021.10.18	ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර	ජනශ්‍රැතිය හා සිංහල සාහිත්‍ය	112
2021.10.22	මහාචාර්ය එස්. ජේ. යෝගරාජා	වර්තමාන ශ්‍රී ලාංකික දෙමළ සාහිත්‍ය නිර්මාණ හා භාෂා භාවිතය	45
2021.10.25	ප්‍රවීණ ලේඛක කමල් පෙරේරා	පාඨකයා උදෙසා යෞවන සාහිත්‍ය කරුවාගේ යුතුකම	71
2021.10.27	ආචාර්ය නිරෝෂා පරණවිතාන	Reading literature in translation	37
2021.10.28	මහාචාර්ය ලියනගේ අමරකීර්ති	නූතන සිංහල නවකතාව	127

බසයෙන් අනාගතයට - පාසල් බස්රථ පුස්තකාල වැඩසටහන

බසයෙන් අනාගතයට - පාසල් බස්රථ පුස්තකාල වැඩසටහන මඟින් නව අත්දැකීමක් යටතේ සිසු දරු දැරියන්ට කියවීමට රුචිකත්වයක් දක්වන පරිසරයක පුස්තකාලය ස්ථාපිත කර පොතපත කියවීම සඳහා පහසුකම් ඇති කරලීමේ අරමුණින් දිවයිනේ එක් දිස්ත්‍රික්කයකින් තෝරාගත්

පාසලක් සඳහා පුස්තකාල පහසුකම් සහිත නවීකරණය කරන ලද බස්රථ ලබා දීම පසුගිය වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහනට සමගාමීව ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, දෙරණ මාධ්‍ය ජාලය සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අනුග්‍රහය දක්වා තිබේ. ඒ අනුව මෙම වසරේ දී පහත සඳහන් පාසල් සඳහා පුස්තකාල බස්රථ ලබා දීමට කටයුතු කර තිබේ.

අනු අංකය	පාසලේ නම	දිස්ත්‍රික්කය	පරිත්‍යාග කළ දිනය
01	මතුගම ශ්‍රී සරණතිස්ස විද්‍යාලය	කලුතර	2021.04.06
02	මාවත්ගම ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලය	කොළඹ	2021.04.08
03	කටුනායක මහා විද්‍යාලය	ගම්පහ	2021.07.16
04	හේමමාලි මහා විද්‍යාලය	අනුරාධපුර	2021.07.20
05	බොරවැව මහා විද්‍යාලය	කුරුණෑගල	2021.07.28
06	වල්ගම්වැව කණිෂ්ඨ විද්‍යාලය	මාතලේ	2021.07.30
07	පොලොන්මාරු ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය	හම්බන්තොට	2021.08.03
08	රත්මල්ගහඇල්ල මහා විද්‍යාලය	මොනරාගල	2021.08.04
09	බෙරමාන මහා විද්‍යාලය	නුවරඑළිය	2021.08.10
10	දෙමටමල්පැලැස්ස මහා විද්‍යාලය	අම්පාර	2021.08.13
11	දෙනියාය පට්ටිගල කනිෂ්ඨ විද්‍යාලය	මාතර	2021.11.03
12	සුන්දරපුරම් සරස්වතී විද්‍යාලය	වව්නියාව	2021.11.26
13	අම්පිලාන්තුරෙයි කලෙයිමහල් විදුහල	මඩකලපුව	2021.12.13
14	ඉයන්කාන්කුලම් විදුහල	මුලතිව්	2021.12.30

ජාතික පුස්තකාල පොත් අලවිහල පවත්වාගෙන යාම

ජාතික පුස්තකාල පොත් අලවිහල පවත්වාගෙන යාමේ මූලික අරමුණ වන්නේ සහනදායී මිල ගණන් යටතේ පොත්පත් ඇතුළු පුස්තකාල ලිපිද්‍රව්‍ය සහ පුස්තකාල සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ අලෙවි කිරීමය. 2021 වසර තුළ මණ්ඩලයීය පොත් අලවිහලෙහි ආදායම රු. 1,299,583.34ක් ලෙස වාර්තා වී තිබේ.

පොත් පරිත්‍යාග ලබා දීමේ වැඩසටහන

දිවයිනේ දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල පොත් එකතු සංවර්ධනය කිරීමේ අරමුණෙන් පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මණ්ඩලය මඟින් මෙම වසර තුළ පහත දැක්වෙන පරිදි පොත් පරිත්‍යාග ලබා දී තිබේ. මෙම වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් පුස්තකාල 43 ක් සහ පිරිවෙන් පුස්තකාල 6 ක් සඳහා පොත් කට්ටල පරිත්‍යාග කිරීම 2021 දෙසැම්බර් මස 10 දින තණමල්විල මධ්‍ය මහා විද්‍යාලයේ දී සිදු කරන ලදී. මෙම වැඩසටහනට සමගාමීව පුස්තකාල භාර ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩසටහනක් පවත්වන ලදී.

පුස්තකාල වර්ගය	පුස්තකාල සංඛ්‍යාව	පොත් සංඛ්‍යාව	වටිනාකම (රු.)
පාසල් පුස්තකාල	147	10888	2,183,014.65
මහජන පුස්තකාල	09	384	90,554.25
දහම් පාසල් / පිරිවෙන් පුස්තකාල	18	1087	258,735.42

ආරක්ෂක අංශ පුස්තකාල	07	372	75,253.25
අමාත්‍යාංශ පුස්තකාල	06	536	125,090.50
වෙනත්	**07**	**526**	**129**,014.00

පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම

- අප්‍රේල් මස 23 දිනට යෙදෙන ලෝක පොත් හා ප්‍රකාශක හිමිකම් දිනය නිමිත්තෙන් **ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය හා ප්‍රායෝගික තත්වයන්'** යන තේමාව යටතේ ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ගීතාංජලී රණවක මහත්මියත්, **බුද්ධිමය දේපළ නීතිය හා එහි නව ප්‍රවණතා** යන තේමාව යටතේ ආචාර්ය ඩී.එම්. කරුණාරත්න මහතාත් දේශනයක් පවත්වන ලදී.
- සෑම වසරකම ඔක්තෝබර් මාසයට යෙදෙන අන්තර් ජාතික පාසල් පුස්තකාල දිනය නිමිත්තෙන් 2021.11.17 දින **"පසු වංඝගත සමයේ පාසල් පුස්තකාලය කෙසේ වෙනස්විය යුතුද''** යන තේමාව යටතේ ආචාර්ය රුවන් ගමගේ මහතා විසින් zoom ඔස්සේ දේශනයක් පවත්වන ලදී.

පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම

දිවයිනේ විවිධ පුස්තකාලවල විවිධ අවශ්‍යතා වෙනුවෙන් උපදේශක සේවා සැපයීම මණ්ඩලයේ ප්‍රමුඛ වගකීමක් වේ. මේ යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පුස්තකාලය, කම්කරු දෙපාර්තමේන්තු පුස්තකාලය, කළුතර නාගොඩ මහජන පුස්තකාලය, හෝමාගම මහජන පුස්තකාලය, වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ චන්කණායි මහජන පුස්තකාලය කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලුම මහජන පුස්තකාල සඳහා මෙම වසර තුළ උපදේශක සේවා සපයා තිබේ.

පුස්තකාල පොත් නිර්දේශ කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශකයින් විසින් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන පොතපත පුස්තකාල පාඨකයින් සඳහා පරිහරණයට සුදුසු ද යන්න නිර්දේශ ලබා දීම මෙහි අරමුණ වේ. මෙමඟින් පාඨකයින් සඳහා කියවීමට සුදුසු පොත් පිළිබඳ මග පෙන්වීමක් සිදු කරනු ලබන අතර මෙම වසර තුළ කෘති 112ක් සඳහා නිර්දේශ ලබා දී තිබෙන අතර කෘති 13ක් ප්‍රතික්ෂේප කර තිබේ.

ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි ආදර්ශ ඩිජිටල් පුස්තකාල 25ක් ස්ථාපිත කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය දියත් කර තිබේ. මෙම ව්‍යාපෘතියේ නියමු අදියර සාර්ථකව අවසන් කිරීමෙන් පසු පළමු අදියරයට අයත් පුස්තකාල 18ක් තෝරා ගැනීම වසරේ පළමු කාර්තුව තුළ නිම කර තිබේ. තෝරාගත් පුස්තකාලවල ජාලකරණ (network) කටයුතු සිදු කිරීම හා අවශ්‍ය විද්‍යුත් උපාංග ලබා දීම මෙම වසරේ දී සිදු කරන ලදී.

පාසල් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ප්‍රකට ව්‍යාපාරික ආයතනයක් වන MAS Active සමඟ එක්ව තෝරාගත් පාසල් පුස්තකාල (05) පහක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ බලාපොරොත්තු වේ. ඒ අනුව තෝරාගත් පාසල්වලට අවශ්‍ය උපකරණ හා පොත්පත් පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කර MAS ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව තෝරාගත් පාසල් පුස්තකාල 5 ක් සංවර්ධනය කරන ලදී. මේ යටතේ අනුරාධපුර රඹෑව සිරිදේවමිත්ත විදුහල, කිලිනොච්චිය

මුදුපුරිප්පු විග්නේෂ්වර විදුහල, දොම්පේ මහ විදුහල, තුල්හිරිය මංගෙදර කනිෂ්ඨ විදුහල, බලංගොඩ පානාත විද්‍යාලය යන පාසල් තෝරාගෙන තිබේ.

සෝමා ජයකොඩි ආදර්ශ පුස්තකාලය හා පුහුණු මධ්‍යස්ථානය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට අනුබද්ධිත ශාඛා පුස්තකාලයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන මෙම පුස්තකාලය මගින් ප්‍රදේශයේ පාඨක ප්‍රායෝජනය සඳහා සේවා පවත්වාගෙන යාමට සැලසුම් කර තිබේ. මෙම පුස්තකාලය සඳහා අවශ්‍ය පොත්පත් රැස් කර ගැනීම හා ඒවායේ මූලික තාක්ෂණ කටයුතු නිම කිරීමට පියවර ගෙන තිබේ. ඒ අනුව පාඨකයන් ලියාපදිංචි කිරීම සහ පොත්පත් බැහැර දීමේ කටයුතු 2021 ඔක්තෝබර් මස 28 දින ආරම්භ කළ අතර වසර අවසානයේ දී පාඨකයන් 22ක් සාමාජිකත්වය ලබා ගෙන තිබේ.

2.9 අධ්‍යාපන හා පුහුණු අංශය

අධ්‍යාපන හා පුහුණු අංශයේ මූලික කාර්යභාරය වන්නේ දැනට සේවයේ නියුතු පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩමුළු පැවැත්වීම මගින් ඔවුන් වෙත අඛණ්ඩ වෘත්තීය පුහුණුවක් ලබාදීම වේ. මේ යටතේ මහජන, පාසල්, පිරිවෙන් ආදී විවිධ වර්ගවලට අයත් පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. ඊට අමතරව පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවණතා පිළිබඳව පුස්තකාලයාධිපතිවරු මෙන්ම විවිධ වෘත්තියවේදීන් දැනුවත් කිරීම සිදුවේ.

පාසල් පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

පාසල් පුස්තකාලයාධිපතිවරු සහ පුස්තකාල කාර්ය මණ්ඩල වෙත පුස්තකාල හා තොරතුරු භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණෙන් මණ්ඩලය මගින් වාර්ෂිකව පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. මේ යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධ්‍යාපන කලාපයේ පාසල් 123 ක් නියෝජනය වන පරිදි පුස්තකාල භාර ගුරුභවතුන් / පුස්තකාලයාධිපතිවරු සඳහා එක් දින පුහුණු වැඩසටහන 2021 පෙබරවාරි මස 18 දින හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයේදී පවත්වන ලදී.

මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම උදෙසා මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් පුහුණු කිරීම මණ්ඩලය මගින් අඛණ්ඩවම සිදු කරනු ලැබේ. මේ යටතේ පහත පරිදි වැඩසටහන් සංවිධානය කර තිබේ.

- නැගෙනහිර පළාතේ මහජන පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු සහ එහි කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල කළමනාකරණය මෙන් ම පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය සම්බන්ධයෙන් දෙදින පුහුණු වැඩසටහනක් 2021 පෙබරවාරි මස 24, 25 යන දිනවල මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී.
- 2030 තිරසර සංවර්ධන පුහුණු වැඩසටහනට සමාගාමී ව කිළිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්ක ඉලක්ක කර ගනිමින් මහජන පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීමේ වැඩසටහනක් 2021 අප්‍රේල් මස 06 දින සිට 08 දින දක්වා කිළිනොච්චිය සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.
- ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවා මණ්ඩලය හා බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව එක්ව කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල මහජන පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුහුණු වැඩමුළු දෙකක් 2021 දෙසැම්බර් මස 02 සහ 03 යන දිනවල දී බත්තරමුල්ල සහකාර පළාත් සභා කොමසාරිස් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

2.10 ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම ප්‍රකාශන ආධාර ව්‍යාපෘති මෙහෙයවීම හා පවත්වාගෙන යාම, මණ්ඩලයේ සියලුම ප්‍රකාශන පළ කිරීම, සම්භාව්‍ය සාහිත්‍ය කෘති සංස්කරණය, පරිවර්තනය හා ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යභාරය වේ. ඊට අමතරව අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතිය යටතේ ISBN/ISSN/ISMN අංක නිකුත් කිරීම හා විවිධ මට්ටමින් ලේඛක ප්‍රජාව වෙත ප්‍රකාශන කටයුතු පිළිබඳව උපදෙස් හා අනුග්‍රහය දැක්වීම මෙම අංශය යටතේ සිදුවේ.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකීය ලේඛක ප්‍රජාව වෙත ග්‍රන්ථකරණය සඳහා අනුග්‍රහය දැක්වීමේ අරමුණෙන් මණ්ඩලය මඟින් 1984 වසරේ සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ ශ්‍රී ලාංකීය ලේඛක ලේඛිකාවන් වෙතින් සුදුසු අත්පිටපත් ලබා ගැනීම සිදු කරනු ලබන අතර නිසි සමීක්ෂණයකට යොමු කිරීමෙන් පසු තෝරාගත් ප්‍රශස්ත මට්ටමේ අත්පිටපත් ප්‍රකාශයට පත් කර ගැනීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දෙනු ලැබේ. මේ යටතේ මෙම වසරේ භාර ගන්නා ලද අත්පිටපත් සංඛ්‍යාව 124කි. මෙම වසර තුළ අනුමත කෘති 15ක් වෙනුවෙන් මණ්ඩලය මඟින් ලබා දී තිබෙන මුද්‍රණාධාරවල වටිනාකම රු.710,885.00කි. අනුග්‍රහය ලැබූ කෘති අතරින් කෘති 02ක් විද්‍යුත් ප්‍රකාශන (e-pub) බවට පරිවර්තනය කර ජාතික ඩිජිටල් පුස්තකාලය වෙත එක් කිරීමට පියවර ගෙන තිබේ.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය - ළමා හා යොවුන් සාහිත්‍ය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ ළමා සහ යොවුන් සාහිත්‍ය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් මෙම ක්ෂේත්‍රයට අදාළව රචිත කෘති සඳහා අනුග්‍රහය ලබා දීම සිදු කරනු ලැබේ. 2021 වසර සඳහා ළමා හා යොවුන් වශයෙන් අත්පිටපත් 25ක් ලැබුණු අතර ඊට පෙර වසරවල ලැබුණු අත්පිටපත් 44ක සමීක්ෂණ කටයුතු ද මෙම වසරේ දී සිදු කරන ලදී.

මෙම වසර තුළ දී ළමා හා යොවුන් සාහිත්‍ය අත්පිටපත් අතුරින් 16ක් අනුමත වූ අතර අනුමත අත්පිටපත් අතුරින් අත්පිටපත් 11ක් සඳහා ලේඛකයන් සමඟ ගිවිසුම්ගත වීම 2021 පෙබරවාරි මස 08 දින සිදු කරන ලදී. ගිවිසුම්වලට එළඹී අත්පිටපත් අතරින් මුද්‍රණ කටයුතු නිමවූ කෘති 09ක් සඳහා ප්‍රකාශන ආධාර වශයෙන් රු.376,075.00ක මුදලක් මණ්ඩලය මඟින් පිරිනමා තිබේ.

නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය

ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියැලෙන ලේඛක ප්‍රජාව වෙත අනුග්‍රහයක් දැක්වීමේ අරමුණෙන් ඔවුන් විසින් රචිත කෘතිවලින් සීමිත පිටපත් සංඛ්‍යාවක් මිල දී ගෙන අනුග්‍රහය දැක්වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. පසුගිය වසර දෙක තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබී යාම මත මිල දී ගත නොහැකි වූ මුද්‍රිත පිටපත් 392ක් අතුරින් කමිටු නිර්දේශ මත තෝරාගත් කෘති 232කින් රු.959,494.00ක් වටිනා පොත් මිල දී ගැනීමට කටයුතු කරන ලදී.

නැට්නෙට් ලංකා (**Natnet Lanka**) පුවත් හසුන

මණ්ඩලය මඟින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන NATNET LANKA පුවත් හසුන 2020 ජනවාරි - ජූනි කලාපය විද්‍යුත් ප්‍රකාශනයක් ලෙස එළි දැක්වීමට කටයුතු කර තිබේ.

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN/ISSN/ISMN)

ශ්‍රී ලංකාව තුළ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන පොතපත ඇතුළු සියලු ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති අංක නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. ඒ අනුව සියලුම පොත් සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) ද, සියලුම වාර ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංකය (ISSN) ද, ප්‍රස්ථාර සහිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිත සංගීත අංකය (ISMN) ද නිකුත් කෙරේ.

මෙම වසරේ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතියෙන් ලද ආදායම රු. 901,60.00 කි.

2021 වර්ෂය තුළ අන්තර් ජාතික ප්‍රමිති අංක (ISBN/ ISSN/ ISMN) නිකුත් කිරීම පහත පරිදි සිදු කර තිබේ.

ප්‍රකාශක වර්ගය	ග්‍රන්ථ නාම සංඛ්‍යාව		
	ISBN	**ISSN**	**ISMN**
වාණිජ මට්ටමේ ප්‍රකාශකයින්	**4272**	**36**	**03**
රජයේ සහ රජයේ නොවන ආයතනික ප්‍රකාශකයින්	**1556**	**199**	**-**
කර්තෘ/පෞද්ගලික ප්‍රකාශකයින්	**2891**	**42**	**17**
එකතුව	**8719**	**277**	**20**

"රටක් වටින පොතක්"පොත් 10000 ලිවීමේ ජාතික වැඩසටහන

COVID 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් 41 ලක්ෂයකට ආසන්න පාසැල් සිසු දරු දැරියන් තම නිවෙස්වලට වී ගත කරන කාලය අතරතුර ඔවුන්ගේ චිත්ත ශක්තිය වර්ධනය කිරීමේ අරමුණෙන් මෙන් ම ඔවුන් තුළ අභියෝග ජයගැනීමේ ශක්තිය වර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක් ව පොත් 10,000ක් ලිවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන දියත් කරන ලදී. සිසු නිර්මාණකරණය සඳහා උපදෙස් ලබා දීම හා නිර්මාණ ඉදිරිපත් කරන ලද සිසු දරුවන් සඳහා සහතික පත් ප්‍රදානය කිරීම 2021.04.21 දින අරලියගහ මන්දිරයේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

2.11 පුස්තකාල සහයෝගිතා අංශය

දේශීය හා විදේශීය පුස්තකාල සමඟ මෙන්ම ක්ෂේත්‍රයට අදාළ විවිධ ආයතන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වාගෙන යාම මූලික කාර්යභාරය වේ. ඒ යටතේ ලෝකයේ විවිධ රටවල ජාතික පුස්තකාල හා වෙනත් ක්ෂේත්‍රයන්ට අයත් පුස්තකාල මෙන්ම අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය _ International Federation of Library Association (IFLA) සමඟ සබඳතා පැවත්වීම, වාර්ෂික සාමාජිකත්වය අලුත් කිරීම සහ දේශීය වශයෙන් විවිධ පුස්තකාල, පුස්තකාල සංගම් හා වෘත්තීය සංගම් සමඟ සබඳතා පැවත්වීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ කටයුතු සිදු කිරීම පුස්තකාල සහයෝගිතා අංශයේ කාර්යභාරය වේ.

හුවමාරු සේවාව

හුවමාරු සේවාව යටතේ දේශීය හා විදේශීය ආයතනවලින් ලැබෙන ප්‍රකාශන ශ්‍රී ලංකා ජාතික

පුස්තකාලය වෙත යොමු කරනු ලැබේ. ඒ අනුව 2021 වසර තුළ කොරියාව, ජපානය, ඕස්ට්‍රේලියාව, තායිලන්තය, චීනය යන රටවල ජාතික පුස්තකාල මගින් ලැබුණු ප්‍රකාශන 72ක් ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය වෙත භාර දී තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ ඓතිහාසික, සංස්කෘතිකමය වැදගත්කම හුවා දැක්වෙන කෘති විවිධ රටවල ජාතික පුස්තකාල වෙත පරිත්‍යාග කිරීම යටතේ ආචාර්ය නීරා වික්‍රමසිංහ මහත්මිය විසින් රචිත **“ Slave in a Palanquin"** ග්‍රන්ථයේ පිටපත් තෝරාගත් ජාතික පුස්තකාල 10ක් වෙත පරිත්‍යාග කිරීමට කටයුතු කර තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ එකතුව සංවර්ධනය සඳහා විවිධ ආයතනවල සහයෝගය ලබා ගැනීම සිදු කෙරේ. මේ යටතේ ජාතික එකතුව ගොඩනැංවීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය වෙතින් පරිත්‍යාග කර එවන ලදී ICARE Proceeding 2020 ග්‍රන්ථයේ මෘදු පිටපත ජාතික ඩිජිටල් පුස්තකාලය වෙත ඇතුළත් කිරීම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලය වෙතින් පරිත්‍යාග කරන ලදී Conference Proceedings ග්‍රන්ථයේ පිටපත් ජාතික එකතුව වෙත ලබා ගැනීමට ද කටයුතු කර තිබේ. National Geographic Society මගින් මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන National Geographic සඟරාව සඳහා වාර්ෂික දායකත්වය ලබාගෙන තිබෙන අතර වසරේ මාස 12ට අදාළ ව කලාප 12ක් ලබාගෙන ජාතික පුස්තකාල එකතුවට එක්කර තිබේ.

ජාත්‍යන්තර සම්බන්ධතා

ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාල පුස්තකාලයට සහ ඊජිප්තු නාගරික පුස්තකාලය වෙත රු. 26,051.00ක් වටිනා ප්‍රකාශන යොමු කිරීමට ද කටයුතු කර තිබේ. තවද මෙම වසරට අදාළව අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) සාමාජිකත්වය අලුත් කිරීමට කටයුතු කළ අතර 1993 වසරේ සිට එහි අඛණ්ඩ සාමාජිකත්වය දරණු ලබයි.

පුස්තකාල ශ්‍රේණිගත කිරීම

2021 වසර තුළ මහජන පුස්තකාල 30ක් ශ්‍රේණිගත කර තිබෙන අතර ඉන් පුස්තකාල 22ක් iii ශ්‍රේණියටත් පුස්තකාල 08ක් ii ශ්‍රේණියටත් ශ්‍රේණිගත කර තිබේ. ඊට අමතරව මහජන හා පාසල් පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා පවත්නා ප්‍රමිති සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු සිදු කර තිබේ. 2021 වසර සඳහා මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ ආදායම රු.99,500.00 කි. ශ්‍රේණිගත කරන ලදී පුස්තකාල පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	පළාත් පාලන ආයතනයේ නම	මහජන පුස්තකාලය	ශ්‍රේණිය
01	මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව	තැන්නේකුඹුර මහජන පුස්තකාලය	ii
02	බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව	බෙලි අත්ත මහජන පුස්තකාලය	ii
03	පොළොන්නරුව මහනගර සභාව	බුද්ධිමණ්ඩප මහජන පුස්තකාලය	ii
04	අක්මීමන ප්‍රාදේශීය සභාව	පින්නදූව මහජන පුස්තකාලය	ii
05	වැලිගෙපොල ප්‍රාදේශීය සභාව	ඕපනායක මහජන පුස්තකාලය	ii
06	කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව	මැණික්හින්න මහජන පුස්තකාලය	ii
07	කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව	දිගන මහජන පුස්තකාලය	ii
08	මිරිගම ප්‍රාදේශීය සභාව	පල්ලේවෙල මහජන පුස්තකාලය	ii
09	කැලණිය ප්‍රාදේශීය සභාව	දළුගම්ගොඩ මහජන පුස්තකාලය	iii
10	දෙහිවල ගලකිස්ස මහනගර සභාව	ගල්කිස්ස ශාඛා පුස්තකාලය	iii
11	දෙහිවල ගලකිස්ස මහනගර සභාව	අත්තිඩිය මහජන පුස්තකාලය	iii
12	ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව	උලපනේ මහජන පුස්තකාලය	iii

13	වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව	ඇත්කඳුර මහජන පුස්තකාලය	iii
14	එරාවුර් පත්තු ප්‍රාදේශීය සභාව	කලවන්කෙනි උදයනිල්ල මහජන පුස්තකාලය	iii
15	එරාවුර් පත්තු ප්‍රාදේශීය සභාව	කිතුල් මහජන පුස්තකාලය	iii
16	පුදුකුඩුඉරිප්පු ප්‍රාදේශීය සභාව	පුදුකුඩුඉරිප්පු මහජන පුස්තකාලය	iii
17	පුදුකුඩුඉරිප්පු ප්‍රාදේශීය සභාව	ඔඩ්ඩුසුඩාන් මහජන පුස්තකාලය	iii
18	කරච්චි ප්‍රාදේශීය සභාව	ස්කන්ධපුරම් මහජන පුස්තකාලය	iii
19	කරච්චි ප්‍රාදේශීය සභාව	මුරසුමොඩෙයි මහජන පුස්තකාලය	iii
20	මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව	මුලතිව් මහජන පුස්තකාලය	iii
21	මන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාව	මන්තායි නැගෙනහිර මහජන පුස්තකාලය	iii
22	සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව	කොටියාගල මහජන පුස්තකාලය	iii
23	තණමල්විල ප්‍රාදේශීය සභාව	කලවැල්ගල මහජන පුස්තකාලය	iii
24	බලපිටිය ප්‍රාදේශීය සභාව	අතිපූජ්‍ය අහුන්ගල්ලේ විමලනන්දතිස්ස නාහිමි අනුස්මරණ මහජන පුස්තකාලය	iii
25	අම්බලන්ගොඩ නගර සභාව	ශ්‍රී ධම්මවංස අනුස්මරණ මහජන පුස්තකාලය	iii
26	මඩකලපුව මහනගර සභාව	බෙන්ඩරි මහජන පුස්තකාලය	iii
27	මඩකලපුව මහනගර සභාව	භාරතිලේන් මහජන පුස්තකාලය	iii
28	මඩකලපුව මහනගර සභාව	මඩ්ඩක්කුලි මහජන පුස්තකාලය	iii
29	මඩකලපුව මහනගර සභාව	නාවත්කුඩා මහජන පුස්තකාලය	iii
30	මඩකලපුව මහනගර සභාව	සින්නඋරනි මහජන පුස්තකාලය	iii

2.12 ක්‍රමෝපාය සැලසුම් අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලුම අංශවල කටයුතු සැලසුම් කිරීමට දායකවීම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ක්‍රමෝපාය සැලසුම් අංශය මගින් ඉටු කෙරේ. මීට අමතරව පාලන කටයුතු විධිමත් කරගෙන යාම සඳහා අවශ්‍ය සහාය ලබාදීම ද මෙම අංශයේ වගකීම වේ. ආයතනයේ විවිධ අංශවල ප්‍රගති වාර්තා ඇසුරෙන් වාර්ෂික, අර්ධ වාර්ෂික හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම, මාසිකව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම ද අංශයේ කාර්යභාරය වේ. ඊට අමතරව විදේශගතවන මණ්ඩලයීය නිලධාරීන් සඳහා අවශ්‍ය ගුවන් ප්‍රවේශ පත්‍ර, වීසා ලබා ගැනීම ආදී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම ද ක්‍රමෝපාය සැලසුම් අංශය මගින් සිදු කෙරේ.

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම

සියලුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ඒ ඒ අංශවල ප්‍රගතිය විමසා බැලීම සඳහා මාසිකව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම යටතේ මෙම වසරේ රටේ පැවැති COVID -19 වසංගත රෝග තත්වය හේතුවෙන් නිරෝධායන ඇදිරිනීතිය පැනවීම මත 2021 වසර තුළ මාස කිහිපයක මාර්ගගත ක්‍රමය ඔස්සේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් 12ක් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09ක් සංවිධානය කර තිබේ.

වාර්ෂික සැලසුම්, ප්‍රගති වාර්තා හා වාර්ෂික වාර්තා සම්පාදනය

2021 වසර සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සැකසීම, 2022 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සහ 2021 වසරේ සියලුම අංශවල ප්‍රගතිය නිරූපනය වන පරිදි මාසික සංක්ෂිප්ත ප්‍රගති වාර්තා 09ක් සම්පාදනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමු කර තිබේ. එමෙන්ම 2020 වර්ෂයට අදාළ පළමු හා දෙවන අර්ධ වාර්ෂික වාර්තා සහ 2021 වර්ෂයට අදාළ පළමු අර්ධ වාර්ෂික වාර්තාව කෙටුම්පත් කිරීම සිදු කරන ලදී. 2018 වාර්ෂික වාර්තාව සකස් කර අමාත්‍ය මණ්ඩල සන්දේශය සමඟ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

විදේශ පුහුණුවීම් හා සම්මන්ත්‍රණ

යුනෙස්කෝ සංවිධානය මගින් සංවිධානය කරනු ලැබූ අස්පර්ශණීය සංස්කෘතික උරුමය සුරැකීමේ කමිටුවේ 16වන සැසිවාරය 2021.12.13 සිට 2021.12.18 දින දක්වා ප්‍රංශයේ පැරිස් නුවර දී පැවති අතර මෙම සමුළුව සඳහා ZOOM ඔස්සේ සම්බන්ධ විය.

2.13 පරිපාලන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු පරිපාලන අංශය යටතේ සිදු වේ. මේ යටතේ සේවක බඳවා ගැනීම්, සේවක නිවාඩු, වැටුප් ණය හා අත්තිකාරම් ලබාදීම, වාහන පාලනය, ගබඩා කටයුතු පාලනය, ආරක්ෂක කටයුතු සංවිධානය හා අධීක්ෂණය, ලේඛනාගාර කළමනාකරණය (Record Room Management), වාර්ෂික තොග සමීක්ෂණ ආදිය සිදු කෙරේ.

සාමාන්‍ය පරිපාලන කටයුතු

ආයතනයේ සේවය නියුතු අදාළ නිලධාරීන් සඳහා දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාදීමට කටයුතු කිරීම, ආරක්ෂක සේවා පිළිබඳ කටයුතු, විදේශ පාර්සල් නිරවුල් කිරීම, සේවක සුබ සාධනය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය, වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම්, නිවාඩු ලේඛන යාවත්කාලීන කිරීම, සාමාන්‍ය/ලියාපදිංචි ලිපි තැපෑලට යොමු කිරීම, මණ්ඩලයේ සේවා නිල ඇඳුම් ලබාදීම, නිල හැඳුනුම්පත් ලබාදීම, තොග සමීක්ෂණය, ගබඩා පාලනය හා ආයතනයේ සියලුම පරිපාලන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට පියවර ගෙන තිබේ.

සේවකයින් පිළිබඳ ආයතනික කටයුතු

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු අතුරෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ කළමනාකරණ හා කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරු පුරප්පාඩු සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම හා මණ්ඩලයේ පුරප්පාඩු වී තිබෙන තනතුරු 09ක් සඳහා අභ්‍යන්තර/බාහිර අයදුම්පත් කැඳවීමට ද කටයුතු කර තිබේ. එමෙන්ම මණ්ඩලයීය අංශ ප්‍රධානීන් දෙදෙනෙකු පත් කිරීමට කටයුතු කර තිබෙන අතර ආධුනික හා මණ්ඩලයීය පුහුණුලාභීන් සඳහා අදාළ කටයුතු සිදු කර තිබේ.

2.14 නඩත්තු අංශය

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව හා නඩත්තු කටයුතුවලට අමතරව මෝටර් රථ නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු අවශ්‍යතාවයන් පරිදි සිදුකර තිබේ. උද්‍යාන නඩත්තු කටයුතු සිදු කිරීම සහ ඊට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීමට කටයුතු කිරීම හා මණ්ඩලයීය ගොඩනැගිල්ල අදාළ බාහිර ආයතනය මගින් දිනපතා පිරිසිදු කිරීමට පියවර ගෙන තිබේ. දුරකථන,

විදුල, ජල හා අන්තර්ජාල බිල්පත් ගෙවීමට කටයුතු කිරීම සහ වසර අවසානයේ දේපළ රක්ෂණය සඳහා අදාළ කටයුතු යොදා තිබේ. 2021 වසරේ ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණ ශාලාව කුළියට ලබාදීම මගින් රු.443,000.00ක ආදායමක් උපයා ගෙන තිබේ.

මීට අමතරව මණ්ඩලයීය ඉඩම නිදහස් දීමනා බලපත්‍රයක් මගින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම. අභ්‍යන්තර නවීකරණ කටයුතු සිදු වන බැවින් අවස්ථානුකූලව ගොඩනැගිල්ලේ ඇතිවන නඩත්තු කටයුතු සිදු කිරීම. නවීකරණ කටයුතුවලදී අපහරණ කළ යුතු භාණ්ඩ මිල ගණන් කැඳවා වෙන්දේසි කිරීම අවශ්‍යතා පරිදි කම්ටු රැස් කොට අවශ්‍ය ස්ථානවලින් භාණ්ඩ ඉවත්කර අලුත්වැඩියා කටයුතු සඳහා ඉඩ පහසුකම් ලබාදීම, මණ්ඩලයීය නව ගොඩනැගිල්ල සැකසීම සඳහා සැලසුම් හා ප්‍රමාණ බිල්පත් සැකසීම හා නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් ලබා ගැනීම. නවීකරණය කරන ලදී කොටස සඳහා අවශ්‍ය ලීබඩු ලබාගැනීමට ප්‍රමාණ බිල්පත් සැකසීම හා ඊට අදාළ කටයුතු සිදු කර තිබේ.

2.15 මුදල් අංශය

2021 වර්ෂයට අයත් අයවැය ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම, මාසිකව පිළියෙල කළ මුදල් පුරෝකථන වාර්තා, ලැබීම් හා ගෙවීම් විස්තර ඇතුළත් කර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නියමිත වේලාවට ලබා ගැනීම සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් විස්තර ද ඇතුළත් කර පිළියෙල කරන ලදී මුදල් පුරෝකථන වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. මෙයට අමතරව මණ්ඩලයේ ලැබීම් හා ගෙවීම්, මුදල් පොත් පරිගණකගත කරන ලද අතර මාසික වාර්තා හා අවසන් ගිණුම් වාර්තා පිළියෙල කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණ වාර්තා පිළියෙල කර තිබේ. මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද මුදල් හා මණ්ඩලයේ ඉපයීම් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් කිරීම සඳහා ද උපයෝගි කර ගන්නා ලදී. රජයේ විගණන අංශයෙන් ලැබුණු විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමත්, සියලු ම බැංකු ගිණුම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් මුදල් පොත් මාසිකව යාවත්කාලීනව පවත්වාගෙන යාමට ද කටයුතු කර ඇත.

සේවක වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් දීමනා යනාදි ගෙවීම් කටයුතු නියමිත දිනවල දී සිදු කරන ලදී. පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නිසි වේලාවට නො ලැබුණු අවස්ථාවල දී මණ්ඩලය විසින් උපයන ලද මුදල් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් සඳහා යොදාගෙන තිබේ.

ලැබීම් ගෙවීම් පිළිබඳ විස්තර සහිතව මුදල් පුරෝකථන වාර්තාව පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මාසිකව ඉදිරිපත් කර මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලදී. මණ්ඩලයට ලැබෙන අනෙකුත් ආදායම් නිසි පරිදි ලබාගැනීමට පියවර ගැනීමත්, මාසික ගිණුම් වාර්තා සකස්කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ. මෙයට අමතරව ලැබීම් හා ගෙවීම් මුදල් පොත් පරිගණකගත කරන ලද අතර එම තොරතුරු ආශ්‍රයෙන් බැංකු සැසඳුම් වාර්තා හා අවසන් ගිණුම් ලිපි ගොනු යාවත්කාලීන කර ඇත.

මෙම වර්ෂයට අදාළව මාසික වැටුප් වාර්තා සකස් කිරීම, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා ව්‍යවස්ථාපිත අඩු කිරීම් සඳහා වාර මුදල් ගෙවීම් කටයුතුත්, අවකරණ ලේඛන සකස් කිරීම, ණය ලේඛන යාවත්කාලීන කිරීම, අවශ්‍ය වැටුප් විස්තර, ඇප තැන්පතු හා අනෙකුත් තොරතුරු ලබාදීම, මෙයට අමතරව මණ්ඩලයීය අවශ්‍යතා සඳහා ලිපිද්‍රව්‍ය සැපයීමත්, අලෙවිහල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, පොත් බැඳුම්හල සඳහා අවශ්‍ය උපකරණ කට්ටල හා රසායනික ද්‍රව්‍ය සැපයීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

2.16 අභ්‍යන්තර විගණන අංශය

මණ්ඩලයීය මුදල් අංශය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව හා ලංකා බැංකුවට අදාළ දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්. කුවිතාන්සි හා බැංකු තැන්පතු පත් පරීක්ෂා කිරීම, ගෙවීම් වවුචර සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම, අත්තිකාරම් ගෙවීම් සහ පියවීම් පරීක්ෂා කිරීම. වැටුප් අවකරණ යටතේ ආපදා ණය ගෙවීම්වලට අදාළ ලේඛන පරීක්ෂා කිරීම, බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි නිවැරදිභාවය පරීක්ෂා කිරීම, මණ්ඩලයීය නිලධාරීන්ගේ වැටුප් ගෙවීම්වලට අදාළ ලිපිගොනු හා වැටුප් ලේඛන පරීක්ෂා කිරීම සිදු කොට තිබේ.

2021 වර්ෂය තුළ මණ්ඩලයේ මුදල් අංශය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව ටවුන්හෝල් හා ලංකා බැංකුවට අදාළ 2021 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්, කුවිතාන්සි පරීක්ෂා කිරීම සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් 01ක් නිකුත් කර ඇත. මහජන බැංකුව පුරහල ශාඛාව සහ ලංකා බැංකුව නිදහස් චතුරශ්‍ර ශාඛාවට අදාළ 2021 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා ගෙවීම් වවුචර්පත් සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් 01ක් නිකුත් කර ඇත. එමෙන්ම රජයේ විගණන අංශ මගින් විමසුම් 02ක් සහ විගණකාධිපති වාර්තා 02ක් යොමු කර ඇති අතර, ඒ සඳහා පිළිතුරු වාර්තා සැපයීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. 2021 වර්ෂය සඳහා මණ්ඩලයීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පවත්වන ලදී. පැවති COVID-19 වසංගත රෝග තත්වය හේතුවෙන් කමිටු රැස්වීම් දෙකක් පැවැත්වීමට නොහැකි විය.

පරිච්ඡේදය 03

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

		31.12.2021 (රු.)	31.12.2020 (රු.)
වත්කම්	සටහන		
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	18,378206.00	13,818,978.00
ලැබිය යුතු දෑ	2	15,231322.00	14,853,670.00
තොගය	3	13,824,956.00	16,445,512.00
කලින් ගෙවීම්	4	658,744.00	1,734,355.00
තැන්පතු	5	378,373.00	385,716.00
		48,471,601.00	**47,238,231.00**
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත හා උපකරණ	6	46,988,078.00	51,493,522.00
ඉඩම සහ ගොඩනැගිලි	7	103,504,516.00	106,158,477.00
වෙනත් ජංගම නොවන වත්කම්	8	38,530,957.00	41,237,807.00
		189,023,551.00	**198,889,806.00**
වත්කම් එකතුව		**237,495,152.00**	**246,128,037.00**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු වියදම්	9	835,085.00	1,603,960.00
උපචිත වියදම්	10	4,554,229.00	5,563,126.00
සේවක ප්‍රතිලාභ	11	335,373.00	340,716.00
වෙනත් ජංගම වගකීම්	12	5,292,079.00	1,521,852.00
		11,016,766.00	**9,029,654.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		48,049,078.00	45,578,972.00
වගකීම් එකතුව		**59,066,474.00**	**54,608,626.00**
ශුද්ධ වත්කම්		**178,428,678.00**	**191,519,411.00**
ශුද්ධ වත්කම් / හිමිකම්			
ප්‍රාග්ධන / වෙනත් අනුග්‍රාහක ආධාර	13	7,030.00	7,030.00
සංචිත	14	8,719,917.00	3,138,634.00
සමුච්චිත අතිරික්තය / (හිඟය)	15	169,701,731.00	188,373,747.00
ශුද්ධ වත්කම් එකතුව		**178,428,678.00**	**191,519,411.00**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර තිබේ.

කේ. වඩුගේ
අධ්‍යක්ෂ (මුදල් හා පාලන)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කරනු ලැබේ.

ඩබ්ලිව්. සුනිල්	ආචාර්ය ආර්. වික්‍රමසිංහ	මහාචාර්ය නන්ද ධර්මරත්න
අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික	සභාපති

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන විස්තරය

	සටහන	31.12.2021 (රු.)	31.12.2020 (රු.)
ආදායම්			
පොත් අලෙවි හලේ වෙළඳ ගිණුම	16	452,899.00	804,042.00
ශ්‍රවණාගාර කුලිය		308,500.00	828,000.00
කුලී හා පාඨක ආදායම	17	2,706,683.00	2,310,513.00
පොලී ආදායම්	18	615,632.00	502,457.00
ප්‍රකාශන දායකත්වය ආදායම	19	428,197.00	440,408.00
වෙනත් ආදායම්	20	855,583.00	891,490.00
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		126,405,000.00	144,300,000.00
වෙනත් ප්‍රතිපාදන -විදේශීය ප්‍රදාන/ ආධාර		1,079,000.00	153,560.00
ආදායම් එකතුව		**132,851,494.00**	**150,230,470.00**
වියදම්			
පුස්තකාල සේවා වියදම්	21	12,424,862.00	7,322,457.00
පරිපාලන හා ආයතනික වියදම්	22	141,164,419.00	153,958,393.00
මූල්‍ය පිරිවැය	23	36,893.00	20,410.00
වියදම් එකතුව		**153,626,174.00**	**161,301,260.00**
අදාළ කාලය සඳහා අතිරික්තය (හිඟය)		**(20,774,680.00)**	**(11,070,790.00)**
වෙනත් ආදායම්			
දේපල, පිරියත හා උපකරණ අලෙවි ලාභය/ (පාඩුව)		-	(887,251.00)
දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභය/ (පාඩුව)		-	(5,661.00)
අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය)		**(20,774,680.00)**	**(11,963,702.00)**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

රු. 000

	සමුච්චිත අරමුදල	ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	වෙනත් ආස්තීත්-වයෙන් ලද ප්‍රාග්ධන දායකත්ව ප්‍රදාන
2019.12.31 දිනට ශේෂය	196,031	959	**7**
පූර්ව වර්ෂ ගැලපීම්	80	-	**-**
2019.12.31 දිනට ගලපන ලද ශේෂය	**196,111**	**959**	**7**
වසර තුළ ගැලපීම්	-	-	-
ශුද්ධ අතිරික්තය /(හිඟය)	(11,964)	-	-
ප්‍රාග්ධන ප්‍රදාන	-	6,405	-
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම	4,226	(4,226)	-
2020.12.31 දිනට ශේෂය	188,373	3,138	7
පූර්ව වර්ෂ ගැලපීම	(16)	-	**-**
2020.12.31 දිනට ගලපන ලද ශේෂය	**188,357**	**3,138**	**7**
ශුද්ධ අතිරික්තය / (හිඟය)	(20,775)	-	-
ප්‍රාග්ධන ප්‍රදාන	-	7,700	-
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම	2,119	(2,119)	-
2021.12.31 දිනට ශේෂය	**169,701**	**8,719**	**7**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

		31.12.2021 රු.
මෙහෙයුම් කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ		
ශුද්ධ අතිරික්තය / (හිඟය)		(20,774,680.00)
ගැලපීම්		
- ක්ෂය කිරීම	11,968,918.00	
	11,968,918.00	
ලාභය/ (පාඩුව) දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීම	-	
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම	3,884,225.00	
		15,853,143.00
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		(4,921,537.00)
(වැඩිවීම) /අඩුවීම තොගයේ	2,620,556.00	
(වැඩිවීම) /අඩුවීම ලැබිය යුතු දෑ	(377,652.00)	
(වැඩිවීම) /අඩුවීම පූර්ව ගෙවීම්	1,075,611.00	
(වැඩිවීම) /අඩුවීම තැන්පතු	7,343.00	
(වැඩිවීම) /අඩුවීම ගෙවිය යුතු දෑ	(768,875.00)	
(වැඩිවීම) /අඩුවීම උපචිත වියදම්	(1,008,895.00)	
(වැඩිවීම) /අඩුවීම සේවක ප්‍රතිලාභ	(5,343.00)	
(වැඩිවීම) /අඩුවීම වෙනත් ජංගම වගකීම්	3,770,227.00	
		5312,972.00
මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මුදල		**391,435.00**
විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම්		(1,413,490.00)
මෙහෙයුම් කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**(1,022,055.00)**
ආයෝජන කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	7,700,000.00	
වසර තුළ ආයෝජන	-	
දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම	(2,118,717.00)	
දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීම් සඳහා මූල්‍යමය ලැබීම	-	
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**5,581,283.00**
දිගුකාලීන ණය කරුවන්ට නැවත ගෙවීම	-	
මූල්‍ය කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		-
ශුද්ධ වැඩිවීම / (අඩුවීම) මූල්‍ය හා මූල්‍ය සමාන දෑ		4,559,228.00
වසර ආරම්භයේ දී බැංකු ශේෂය		13,818,978.00
වසර අවසානයේ දී මූල්‍ය හා මූල්‍ය සමාන දෑ		**18,378,206.00**
2021.12.31 දිනට බැංකුවේ මුදල		**18,378,206.00**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතට අනුව පිහිටුවන ලද මෙම ආයතනය 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත බවට සංශෝධනය විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ලෙස රට තුළ පුස්තකාල සේවා සංවර්ධනය කිරීම වෙනුවෙන් සැලසුම් සැකසීම හා ආධාර කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාම, මහජන පුස්තකාල හා පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම වෙනුවෙන් උපදෙස් හා ආධාර දීම, කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම, ග්‍රන්ථ සංවර්ධනය හා ප්‍රලේඛන කටයුතු සඳහා අතහිත දීම ආදිය වේ. ආයතනයේ ලියාපදිංචි ලිපිනය අංක 14, නිදහස් මාවත, කොළඹ 07 වේ.

01 පොදු

01.01 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

අ) මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් විස්තර සහ අයවැයගත හා සත්‍ය වියදම් විචලන ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.ගි.ප්‍ර) අනුව සකස් කර ඇත.
ආ) ඓතිහාසික වටිනාකම් අගයන්ට යටත්ව මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.
ඇ) මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී උද්ධමනීය සාධක ගලපා නොමැත.
ඈ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න රුපියලට සකස් කරන ලදී.
ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
ඊ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ සංකල්පයට අනුව පිළියෙල කර තිබේ.

01.02 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව අනුගමනය කරන ලද අතර පසුගිය වසරේ අගයන් හා ප්‍රකාශ අනුරූපීව අවශ්‍ය පරිදි නැවත ගළපමින් පවත්නා වසරට ඉදිරිපත් කරන ලදී.

01.03 නොවෙනස්ව ඉදිරිපත් කිරීම

2021 දී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සහ අයිතම වර්ගීකරණය කිරීමේ වෙනස් කිරීමක් සිදු කර නොමැත

02 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වත්කම් ජංගම ලෙස වර්ග කර ඇත්තේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියට අනුව වර්ෂයක් තුළ දී හෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක් ඇතුළත දී මුදල් හෝ මුදල් හා සමාන දෑ බවට පත්වන දෑ වේ.

02.01 දේපළ, පිරියත හා උපකරණ සහ ක්ෂයවීම

02.01.01 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම පෙන්වා දී ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට ය. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ගණනය කර ඇත්තේ ඒවා මිල දී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ එම වත්කම් වර්තමාන තත්වයට ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ද ඇතුළත්වය.
සපයනු ලබන සේවා ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් වත්කම් අත්පත් කර ගැනීමේ, අලුත්-වැඩියා කිරීමේ සහ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ස්ථීර ස්වභාවයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී.

02.01. 02 ක්ෂයවීම

හීනවන ශේෂ ක්‍රමය අනුව ස්ථාවර වත්කම් පහත සඳහන් පරිදි ක්ෂය කිරීම් කර ඇත.

ගොඩනැගිල්ල	2.5%
මෝටර් රථ	10%
කාර්යාලයීය ලී බඩු හා උපකරණ	10%
පරිගණක හා පරිගණක උපාංග	10%
පුස්තකාල උපකරණ	10%
පොත් බැඳුම් උපකරණ	10%
ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	10%
පිරියත හා යන්ත්‍ර	10%
පොත් තොගය (ජාතික පුස්තකාලය)	10%
සංඛ්‍යාංක සංචිතය (ජාතික පුස්තකාලය)	10%
Kiyawamu.lk	10%

2014.01.01 දිනට පෙර මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම්, ඒවායේ ඉතිරි ඵලදායි ආයු කාලය පුරාවට ක්ෂය වීම් ගණනය කරන ලද මිලදීගත් /අත්පත්කර ගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වෙන් නොකරන ලදී. වත්කම් බැහැර කරන විට සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂයවීම් වෙන් කරන ලදී. 2014.01.01 දිනට පසු ජාතික පුස්තකාල පොත් තොගය හැර මිලදීගත් /අත්පත්කරගත් ස්ථාවර වත්කම් ඒවා මිලදීගත් / අත්පත් කර ගත් දිනය පදනම් කර ගෙන ක්ෂය වීම් වෙන් කරයි. 2014.01.01 දිනට පසුව මිලදී ගත් ජාතික පුස්තකාල පොත් තොගය, ඒවා මිලදීගත් / අත්පත් කර ගත් මාසය පදනම් කරගෙන ක්ෂවීම් වෙන් කරනු ලැබේ.

02.02 තොග

තොගය එහ පිරිවැය වටිනාකමට අගය කරනු ලබයි. කෙසේ වුවද පරිත්‍යාග ඒවාහි ඇස්තමේන්තුගත වටිනාකමට අගය කරනු ලබයි.

02.03 ලැබීම්

ලැබීම් ලෙස අයවේ යැයි අපේක්ෂිත ද්‍රව්‍යවල වටිනාකම ලැබීම් යටතේ දක්වා ඇත.

02.04 ස්ථාවර වත්කම් තක්සේරු කිරීම

රු. 96512.16ක් වටිනා පුස්තකාල උපකරණ 2021.12.31 දිනට භෞතිකව නොපවතින බවට හඳුනාගෙන තිබේ. එලෙස භෞතිකව නොපවතින බැවින් වාර්ෂික ක්ෂයවීම් ගණනය කර නොමැත.

02.05 ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ප්‍රාග්ධන ප්‍රදානවලින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත කරන ලද සම්පූර්ණ වටිනාකම වර්ෂයේ සමුච්චිත අරමුදලට මාරු කර තිබේ.

02.06 ස්ථාවර වත්කම් බැහැර කිරීම / පරිත්‍යාග කිරීම

ඉවත් කළ / පරිත්‍යාග කළ හැකි ස්ථාවර වත්කම් ලෙස රු.0 ක අගයන් හඳුනාගෙන ඇති අතර එය එම වසර තුළ දී ඉවත් කොට ඇත.

03 වගකීම් හා වෙන්කිරීම්

මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක් ඇතුළත දී ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම්, ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ වර්ග කර තිබේ.

මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක ඉක්ම ගිය පසු ගෙවිය යුතු ගෙවීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර තිබේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන දිනට හෙළිදරව් වූ සියලු වගකීම් ගිණුම් ගත කර තිබේ.

03.01 විශ්‍රාමික ප්‍රතිලාභ

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මණ්ඩලයේ සේවකයින් සඳහා විශ්‍රාමික පාරිතෝෂික වෙන් කිරීම් කර තිබේ. කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුකූලව වසර 05ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පමණක් විශ්‍රාමික පාරිතෝෂික ගෙවිය යුතු වේ. මෙම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

03.02 හඳුනාගත් සේවක දායකත්ව සැලැස්ම - සේ.අ.ඇ. සහ සේ.භා.අ.

මණ්ඩලයේ සියලුම සේවකයින් සේ.අ.ඇ. සහ සේ.භා.අ. දායකත්ව මුදල් යැවීමට සුදුසුවන අනුරූපීව අතර ව්‍යවස්ථාපිත නීතිරීතිවලට අනුව ඒ සඳහා මණ්ඩලයෙන් 12%ක් හා 3%ක් වශයෙන් දායකත්ව දරනු ලැබේ.

03.03 මෙහෙයුම් කල්බදු යටතේ වාහන කුලියට ගැනීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වැන් රථයක් සහ කැබ් රථයක් මෙහෙයුම් කල්බදු යටතේ අත්පත් කරගෙන ඇත. 2018 සැප්තැම්බර් මස 05 වන දින සිට ගිවිසුම්ගත වී ඇති අතර එය මාස 60 කින් අවසන් වේ. මණ්ඩලය මේ සඳහා මාසිකව රු.169,369/- බදු, සහ රු.164,300/- බදු, ලෙස අනුරූපීව කල්බදු වාරික ගෙවනු ලබයි.

මෙහෙයුම් කල්බදු වගකීම පහත පරිදි වේ. (බදු සමග)

2022 (ජංගම වගකීම්)	රු. 4,492,000/-
2023 (ජංගම නොවන වගකීම්)	රු. 3,148,000/-

04 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

04.01 ආදායම්

අ) මණ්ඩලයේ ඉපැයීම් යටතේ ග්‍රවණාගාර කුලී ආදායම, අලෙවිහලේ ආදායම, පොලී ආදායම, සහ විවිධ ආදායම් ලෙස හඳුනා ගැනේ.
ආ) සියලු ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන තිබේ.
ඇ) 2021 වසර සඳහා රජයේ ප්‍රදාන වශයෙන් පුනරාවර්තන ආධාර රු. 126,405,000/- ක් හා ප්‍රාග්ධන ආධාර රු. 7,700,000/- ක් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබේ.

04.02 ආදායම් හඳුනාගැනීම

අ) ඉහත උපචිත පදනම මත ලද ආදායම්, අදාළ වියදම් හා ගළපා ඇත.
ආ) පොලී ආදායම කාල පදනම මත උපචිත කර තිබේ.
ඇ) විදේශීය ප්‍රධාන විලම්භිත ආදායමක් ලෙස සලකන ලද අතර දරන ලද සත්‍ය වියදම පදනම් කරගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබේ.

04.03 වියදම්

මණ්ඩලයේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් උපචිත පදනම මත ආදායමට එරෙහිව ගැලපීමෙන් පසු වර්ෂයේ අතිරික්තය/ හිඟය නිරූපණය කර තිබේ.

05 රජයේ ප්‍රදාන

වර්ෂය තුළ ලද රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සන්සඳනාත්මක වටිනාකමකින් යුතුව අදාළ පිරිවැය හා සසඳා ආදායම ලෙස හඳුනාගෙන තිබේ.

06 <u>මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති /02, මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමවේදය අනුගමනය කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ.

07 මූල්‍ය තත්වයන් ඉදිරිපත් කරන දිනට පසුව සිදු වූ සිදුවීම්

මූල්‍ය තත්ව වාර්තා දිනට පසු සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අවශ්‍ය පරිදි සලකා බලා හෙළිදරව් කිරීම් සහ අදාළ පරිදි ගැලපීම් සිදු කර ඇත.

07.01 ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කිරීම

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙහි ස්වාධීන තක්සේරුකරුවන් විසින් ජාතික පුස්තකාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල 2023 අගෝස්තු 15 දිනට පහත පරිදි තක්සේරු කරනු ලැබීය.

ඉඩම (හෙක්ටයාර 1.0783)	රු. 6,392,100,000.00

මෙම ඉඩම 2021 දෙසැම්බර් මස 06 වන දින කැබිනට් පත්‍රිකාවේ අනුමැතියෙන් මණ්ඩලය වෙත නොමිලේ ලබා දී ඇත.

ආ) 2019 ජූනි 23 වන දින බණ්ඩාරගම, මැදගම ඉඩම සහිත සෝමා ජයකොඩි ගොඩනැගිල්ල ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පරිත්‍යාග කර ඇත.

දේපලෙහි නාමික වටිනාකම	රු. 2,000,000.00
(ඉඩම පර්චස් 12)	

07.02 පොත් තොගයේ වටිනාකම - ජාතික පුස්තකාලය

2021 දෙසැම්බර් 31 දිනට පොත් තොගයේ ගිණුම් වටිනාකම රු. 112,360,740.00 කි. නමුත් මෙය නොමිලයේ ලැබුණු පුස්තකාල ලේඛන සම්පත් නියෝජනය නොකරයි. එබැවින් 2023 වර්ෂයේ සිට ඒවා අගය කිරීමට සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය නියෝජනය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත.

මූල්‍ය තත්ත්වයේ සිදුවීම් පිළිබඳ සියලුම ද්‍රව්‍යමය ප්‍රකාශ සලකා බලා ආවරණය කර අදාළ වන තැනට සකස් කර ඇත.

08 බැංකු ගිණුම්

මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් අස්තීත්වයන්ගෙන් ප්‍රාග්ධන ලැබීම් ගනුදෙනු සටහන් කිරීම සඳහා ජංගම ගිණුම් අංක 100113398963 දරන මහජන බැංකු ගිණුම් නඩත්තු කරනු ලබන අතර ආයතනයේ මෙහෙයුම් කටයුතු සටහන් කිරීම සඳහා අනෙක් ජංගම බැංකු ගිණුම් දෙක නඩත්තු කරනු ලබයි.

09 අමතර සටහන්

ජාතික පුස්තකාල ගොඩනැගිල්ල පසුගිය වසරේ සිට නවීකරණය කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 211ක බදුවේ.

මූල්‍ය විස්තර සටහන්

		31.12.2021	31.12.2020
		රු.	රු.
සටහන් 01 මුදල් හා මුදල් සමාන දෑ			
ගිණුම් අංකය 2323283 -ලංකා බැංකුව		5,869,856.00	7,535,967.00
ගිණුම් අංකය 100113398963 -මහජන බැංකුව		6,424,764.00	888,096.00
ගිණුම් අංකය 100163170315 -මහජන බැංකුව		5,863,823.00	5,175,152.00
පොත් හුවමාරු සේවාව සඳහා තැන්පත් -ජා.ඉ.බැ		219,763.00	219,763.00
		18,378,206.00	**13,818,978.00**
සටහන් 02 - ලැබිය යුතු දෑ			
උත්සව අත්තිකාරම්		61,750.00	11,750.00
ආපදා ණය		15,001,372.00	14,489,584.00
විශේෂ අත්තිකාරම්		4,000.00	6,000.00
සුළු මුදල් අග්‍රිමය		4,714.00	4,714.00
විවිධ අත්තිකාරම්		159,486.00	341,622.00
		15,231,322.00	**14,853,670.00**
සටහන් 03 - තොගය			
පොත් තොගය - ජාත්‍යන්තර පොත් හුවමාරු සේවාව		106,435.00	106,435.00
පොත් තොගය - අලෙවිය සහ බෙදා හැරීම		3,239,548.00	5,165,147.00
පොත් තොගය - සම්භාව්‍ය		5,180,082.00	5,231,161.00
ලිපිද්‍රව්‍ය තොගය - පුස්තකාල		335,247.00	552,783.00
ලිපිද්‍රව්‍ය තොගය -කාර්යාල		1,519,141.00	1,632,769.00
පොත්හලේ වෙළඳ තොගය		3,444,503.00	3,757,217.00
		13,824,956.00	**16,445,512.00**
සටහන් 04 පූර්ව ගෙවීම්			
අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාල උපකරණ		422,558.00	622,040.00
දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර		51,660.00	103,890.00
රක්ෂණ හා බලපත්‍ර - මෝටර් රථ		88,250.00	65,028.00
රක්ෂණ - දේපළ		96,276.00	96,277.00
තොරතුරු තාක්ෂණ වියදම්		-	847,120.00
		658,744.00	**1,734,355.00**
සටහන් 05 - තැන්පතු			
ඉන්ධන සඳහා තැන්පතු		50,000.00	50,000.00
සේවක ආරක්ෂක තැන්පතු - (ජා. ඉ. බැ.)		328,373.00	335,716.00
		378,373.00	**385,716.00**
සටහන් 06 - යටිතල පහසුකම්, පිරියත හා උපකරණ			
පුස්තකාල උපකරණ	6.I	9,137.00	26,206.00
ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	6.II	2,918.00	3,242.00
පොත් බැඳුම් උපකරණ	6.III	4,345,660.00	4,828,511.00
කාර්යාල ලී බඩු හා උපකරණ	6.IV	18,786,628.00	20,142,523.00
පරිගණක හා පරිගණක උපකරණ	6.V	8,198,632.00	9,109,592.00
පිරියත සහ යන්ත්‍ර සූත්‍ර	6.VI	1,974,491.00	2,193,879.00
මෝටර් රථ	6.VII	13,670,612.00	15,189,569.00
		46,988,078.00	**51,493,522.00**

සටහන් 07 - ඉඩම හා ගොඩනැගිලි			
ජාතික පුස්තකාල ගොඩනැගිල්ල	7.I	103,088,597.00	105,731,894.00
ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල	7.II	415,919.00	426,583.00
		103,504,516.00	**106,158,477.00**
සටහන් 08 - වෙනත් මූල්‍ය නොවන වත්කම්			
පොත් තොගය -- ජාතික පුස්තකාලය	8.I	29,292,799.00	30,994,504.00
ජාතික පුස්තකාලය - **සංඛ්‍යාංක එකතුව**	8.II	7,189,609.00	7,967,138.00
Kiyawamu.lk	8.III	2,048,549.00	2,276,165.00
		38,530,957.00	**41,237,807.00**
සටහන් 09 - ගෙවිය යුතු දෑ			
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		194,738.00	309,500.00
රඳවාගත් මුදල්		527,461.00	548,461.00
ගෙවිය යුතු මුද්දර ගාස්තු		10,550.00	21,725.00
ගෙවිය යුතු VAT		15,192.00	15,192.00
ගෙවිය යුතු WHT		64,200.00	64,200.00
වෙළඳ හිමියෝ		22,944.00	644,882.00
		835,085.00	**1,603,960.00**
සටහන් 10 - උපචිත වියදම්			
අතිකාල හා නිවාඩු ගෙවීම්		78.913.00	66,016.00
ශ්‍රවණාගාර දීමනා		15.600.00	1,200.00
සංග්‍රහ වියදම්		86.500.00	79,480.00
සේවක ගමන් වියදම් (දේශීය)		4.812.00	12,615.00
සුබසාධන වියදම්		-	7,130.00
විශේෂ කමිටු ගාස්තු		-	1,000.00
කාර්යාලයීය ලිපිද්‍රව්‍ය		-	1,875.00
පුවත්පත් සහ ප්‍රකාශන		78,000.00	-
ඉන්ධන සහ ලිහිසි තෙල්		-	24,040.00
සනීපාරක්ෂක වියදම්		280,825.00	286,070.00
දුරකථන		163,079.00	160,010.00
විදුලිය		7,331.00	814,119.00
ජලය		37,179.00	30,038.00
තැපැල් ගාස්තු		-	18,000.00
තොරතුරු තාක්ෂණ (අන්තර්ජාල ගාස්තු)		29,482.00	17,353.00
ආරක්ෂක වියදම්		372,603.00	323,720.00
අලුත් වැඩියාව හා නඩත්තුව -කාර්යාල උපකරණ		13,310.00	6,000.00
දැන්වීම් ගාස්තු		-	6,394.00
පුස්තකාල සාහිත්‍ය සහ ප්‍රකාශන වියදම්		71,000.00	-
ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශන වියදම්		271,000.00	-
පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා		-	1,500.00
නව ප්‍රකාශන මිලදී ගැනීමේ වියදම්		10,976.00	75,852.00
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන වියදම්		190,000.00	675,270.00
ඡායාරූප සේවාව		58,010.00	39,894.00
වෙනත් උපචිත වියදම්		278,509.00	-
විගණන ගාස්තු		2,507,100.00	2,915,550.00
		4,554,229.00	**5,563,126.00**

සටහන් 11 - සේවක ප්‍රතිලාභ

සේවක ආරක්ෂක තැන්පතු	173,253.00	189,253.00
සේවක ආරක්ෂක තැන්පතු පොළිය	162,120.00	151,463.00
	335,373.00	**340,716.00**

සටහන් 12 - වෙනත් ජංගම වගකීම්

සාමාන්‍ය ණය හිමියන්	989,372.00	989,372.00
පොදු රාජ්‍ය මණ්ඩලයීය ඉගෙනුම් ව්‍යාපෘතිය	885,393.00	532,480.00
ICHCAP Vedio නිෂ්පාදන ව්‍යාපෘතිය	3,417,314.00	-
	5,292,079.00	**1,521,852.00**

සටහන් 13 - ප්‍රාග්ධන / වෙනත් ආයතනවලින් ලද ප්‍රදාන

ප්‍රදාන හා පරිත්‍යාග ගිණුම	7,030.00	7,030.00
ශේෂය ඉ / ගෙ	-	-
එකතු කළා - වෙනත් අස්තීත්වයන්ගෙන් ලද ප්‍රාග්ධනය	7,030.00	7,030.00
වර්ෂය තුළ ගැලපීම්	-	-
	7,30.00	**7,030.00**

සටහන් 14 - සංචිත

ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන		
ශේෂය ඉ / ගෙ	3,138,634.00	959,147.00
ගැලපීම්	-	-
	3,138,634.00	959,147.00
එකතු කලා - භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන	7,700,000.00	6,405,000.00
	10,838,634.00	7,364,147.00
අඩු කලා - ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම්	(2,118,717.00)	(4,225,513.00)
	8,719,917.00	**3,138,634.00**

සටහන් 15 - සමුච්චිත අරමුදල

ශේෂය ඉ/ගෙ	188,373,747.00	196,031,572.00
වර්ෂයේ ගැලපීම්	(16,053,00)	80,364.00
	188,357,694.00	196,111,936.00
එකතු කිරීම් / අඩු කිරීම්		
වියදම් ඉක්ම වූ ආදායම් වල එකතුව	(20,777,680.00)	(11,963,702.00)
ප්‍රාග්ධන වත්කම් අත්පත් ගැනීම්	2,118,717.00	4,225,513.00
	169,701,731.00	**188,373,747.00**

සටහන් 16 - පොත් අලෙවිහලේ වෙළඳ ගිණුම

පුස්තකාල ලිපිද්‍රව්‍ය අලෙවිය	578,003.00	868,056.00
බැදුම් ද්‍රව්‍ය අලෙවිය	109,780.00	357,825.00
පොත් -ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය	(13,123.00)	128,728.00
දුම්මල තෙල් අලෙවිය	82,500.00	32,500.00
කාර්යාල උපකරණ අලෙවිය	8,317.00	27,349.00
පොත් අලෙවි හලේ වෙළඳ ගිණුම	(312,578.00)	(610,416.00)
	452,899.00	**804,042.00**

සටහන් 17 - අය කිරීම්, දඩ හා අයභාර

අත්පිටපත් සමීක්ෂණයට ලද ගාස්තු	215,772.00	14,016.00
පාඨකයන් ලියාපදිංචි කිරීමෙන් ලද ගාස්තු	200,290.00	254,155.00
ISBN ව්‍යාපෘතියෙන් ලද ගාස්තු	1,136,533.00	905,232.00
පුස්තකාල සේවා මගින් ලද ගාස්තු	1,154,088.00	1,137,110.00
	2,706,683.00	**2,310,513.00**

සටහන් 18 - පොළී ආදායම

ආපදා ණය	611,536.00	498,303.00
විශේෂ අත්තිකාරම්	4,096.00	4,154.00
	615,632.00	**502,457.00**

සටහන් 19 - ප්‍රකාශන බෙදා හැරීම ආදායම

ජාතික ග්‍රන්ථ නාමාවලියේ අලෙවිය	47,200.00	164,295.00
මණ්ඩලයීය ප්‍රකාශන අලෙවිය	380,997.00	276,113.00
	428,197.00	**440,408.00**

සටහන් 20 - වෙනත් ආදායම්

ඡායාපිටපත් ගාස්තු	230,620.00	144,389.00
ටෙන්ඩර් අයදුම්පත් අලෙවිය	63,054.00	176,762.00
ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අයදුම්පත් ගාස්තු	31,150.00	30,950.00
පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ ලැබීම්	110,800.00	109,200.00
භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අලෙවි ආදායම	-	185,265.00
විවිධ ආදායම්	419,959.00	244,924.00
	855,583.00	**891,490.00**

සටහන් 21 - පුස්තකාල සේවා වියදම්

සාමාජික ගාස්තු- ජාත්‍යන්තර පුස්තකාල	194,700.00	128,044.00
ජාත්‍යන්තර හුවමාරු සේවය	44,012.00	11,175.00
ප්‍රතිග්‍රහණ වියදම්	7,925.00	7,330.00
පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ වියදම්	156,569.00	-
පාඨක අධ්‍යාපන හා ප්‍රචාරක වියදම්	192,095.00	214,472.00
ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම	360,350.00	145,371.00
පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා	244,921.00	34,862.00
පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම	4,298,379.00	2,273,808.00
ජාතික කියවීමේ මාසයේ වියදම්	174,263.00	229,960.00
ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය	43,334.00	97,998.00
පුස්තකාල විශේෂ දින සැමරීම	25,518.00	185,630.00
තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වියදම්	853,620.00	219,684.00
අන්තර්ජාල වියදම්	348,995.00	146,616.00
ද්‍රව්‍ය සංඛ්‍යාංකකරණය පුස්තකාල වියදම්	82,420.00	28,698.00
පුස්තකාල අධ්‍යාපන සම්මන්ත්‍රණ	436,074.00	144,616.00
සම්මන්ත්‍රණ, දේශන හා පුහුණු වැඩමුළු	120,799.00	86,340.00
විශේෂ පාඨමාලා සඳහා ගාස්තු	32,340.00	77,840.00
පොදු රාජ්‍ය මණ්ඩලයීය අධ්‍යාපන ව්‍යාපෘති වියදම්	929,000.00	153,560.00
රටක් වටින පොත්ක ව්‍යාපෘති වියදම්	397,610.00	-
අත්පිටපත් සමීක්ෂණ ගාස්තු	492,812.00	393,610.00
පුස්තකාල සාහිත්‍ය හා ප්‍රකාශන වියදම්	226,750.00	94,335.00
අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක	373,472.00	270,183.00
පොත් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපනය කිරීම	1,632,592.00	2,208,516.00
පුස්තකාල පර්යේෂණ වියදම්	743,047.00	156,688.00
පුස්තකාල සහයෝගීතා වියදම්	13,265.00	13,121.00
	12,424,862.00	**7,322,457.00**

සටහන් 22 -පරිපාලන හා ආයතනික වියදම්

සේවක වැටුප්, වේතන හා සේවක දීමනා	22.1	100,774,428.00	105,169,892.00
සැපයීම් හා උපයෝජන භාවිතය	22.2	23,994,246.00	29,445,032.00
අලුත් වැඩියා හා නඩත්තු ප්‍රාග්ධන වත්කම් වියදම්	22.3	3,449,832.00	5,387,787.00
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	22.4	11,968,918.00	12,787,062.00
වෙනත් වියදම්	22.5	976,995.00	1,168,620.00
		141,164,419.00	**153,958,393.00**

සටහන් 23 - මූල්‍ය වියදම්

බැංකු ගාස්තු	36,893.00	20,410.00
	36,893.00	**20,410.00**

මූල්‍ය විස්තර සටහන්

සටහන් 6, 7, 8 - 2021 දෙසැම්බර් 31 දිනට පිරියත දේපළ හා උපකරණ

සටහන්	විස්තරය	ක්ෂය වීම් අගය (%)	2021.01.01 දිනට වටිනාකම	එකතු කිරීම්	ඉවත් කිරීම්	2021.12.31 දිනට මුළු පිරිවැය	2021.01.01 දිනට සමුච්චිත ක්ෂය	එකතු කිරීම් ඉවත් කිරීම්	2021 වසර සඳහා ක්ෂය	2021.12.31 දිනට මුළු ක්ෂය	ශුද්ධ වටිනාකම
6.I	පුස්තකාල උපකරණ	10%	96,512.16	-	-	96,512.16	86,359.33	-	- 1,015.28	87,374.61	9,137.55
6.II	ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	10%	46,874.00	-	-	46,874.00	43,631.66	-	324.23	43,955.89	2,918.11
6.III	පොත් බැඳුම් උපකරණ	10%	9,122,007.00	-	-	9,122,007.00	4,293,495.72	-	482,851.13	4,776.346.85	4,345,660.15
6.IV	කාර්යාල ලී බඩු හා උපකරණ	10%	42,028,592.54	667,095.00	-	42,695,687.54	21,886,069.91	-	2,022,990.05	23,909,059.96	18,786,627.58
6.V	පරිගණක හා පරිගණක උපාංග	10%	18,033,692.68	-	-	18,033,692.68	8,924,101.39	-	910,959.13	9,835,060.52	8,198,632.16
6.VI	පිරියත හා යන්ත්‍රසූත්‍ර	10%	6,159,707.72	-	-	6,159,707.72	3,965,828.68	-	219,387.90	4,185,216.58	1,974,491.14
6.VII	මෝටර් රථ	10%	32,270,761.74	-	-	32,270,761.74	17,081,193.05	-	1,518,956.87	18,600,149.92	13,670,611.82
7.I	ජාතික පුස්තකාල ගොඩනැගිල්ල	2.5%	144,437,913.56	-	-	144,437,913.56	38,706,019.73	-	2,643,297.35	41,349,317.08	103,088,596.48
7.II	ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල	2.5%	803,320.09	-	-	803,320.09	376,736.62	-	10,664.59	387,401.21	415,918.88
8.I	ජාතික පුස්තකාලයේ පොත් තොගය	10%	112,360,740.16	1,430,842.70	-	113,791,582.86	81,366,236.41	-	3,132,547.25	84,498,783.66	29,292,799.20
8.II	ජාතික පුස්තකාල - සංඛ්‍යාංක එකතුව	10%	10,376,611.65	20,778.93	-	10,397,390.58	2,409,474.15	-	798,307.75	3,207,781.90	7,189,608.68
8.III	Kiyawamu.lk	10%	2,726,001.60	-	-	2,726,001.60	449,836.76	-	227,616.48	677,453.24	2,048,548.36
	එකතුව		**378,462,734.90**	**2,118,716.63**	**-**	**380,581,451.53**	**179,588,983.41**	**-**	**11,968,918.01**	**191,557,901.42**	**189,023,550.11**

සටහන් 22.1 - වැටුප් චේතන හා සේවක දීමනා

වැටුප් හා චේතන	82,081,615.00	83,120,976.00
සේ. අ. අ.	9,122,687.00	9,250,274.00
සේ. භා. අ.	2,280,672.00	2,312,569.00
අතිකාල හා නිවාඩු දින ගෙවීම්	869,782.00	904,910.00
පාරිතෝෂික	3,884,225.00	7,383,974.00
මණ්ඩලයීය සාමාජික පාරිශ්‍රමිකය	637,000.00	782,000.00
කමිටු සාමාජික පාරිශ්‍රමිකය	164,000.00	192,800.00
ශ්‍රවණාගාරයේ වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම්	32,600.00	53,000.00
ගමන් වියදම්	118,709.00	96,243.00
විදේශ ගමන් හා අධ්‍යාපනික වැඩසටහන්	3,447.00	30,398.00
සේවක නිල ඇඳුම්	24,000.00	24,000.00
වෛද්‍ය පර්යේෂණ ගාස්තු	11,450.00	1,750.00
සුබසාධන වියදම්	664,329.00	344,133.00
සංග්‍රහ වියදම්	137,897.00	124,582.00
සහනදායී දුම්රිය ප්‍රවේශ පත්‍ර	518,040.00	547,583.00
තරඟ විභාග ගාස්තු	223,975.00	700.00
	100,774,428.00	**105,169,892.00**

සටහන් 22.2 - සැපයීම් හා උපයෝජන වියදම්

කාර්යාල ලිපිද්‍රව්‍ය	1,449,444.00	1,568,354.00
මණ්ඩලයීය දේපල රක්ෂණය	128,369.00	136,692.00
වාහන රක්ෂණය	472,780.00	441,400.00
ඉන්ධන සහ ලිහිසි තෙල් වියදම්	969,729.00	693,348.00
දුරකථන වියදම්	2,012,189.00	2,091,629.00
විදුලිය සඳහා වියදම්	5,180,152.00	11,615,049.00
ජල බිල්පත් වියදම්	325,109.00	599,303.00
ආරක්ෂක වියදම්	4,178,227.00	3,718,470.00
සනීපාරක්ෂක වියදම්	3,328,000.00	3,107,318.00
මෙහෙයුම් කල්බදු වාරික	4,324,356.00	4,284,288.00
මුද්‍රණ වියදම්	9,010.00	186,828.00
පුවත්පත් හා ප්‍රකාශන	180,120.00	196,500.00
දැන්වීම් සඳහා වියදම්	798,472.00	181,204.00
තැපැල් ගාස්තු	391,529.00	402,847.00
සැලසුම් පිළියෙල කිරීමේ හා පරිවර්තන වියදම්	234,010.00	219,302.00
විශේෂ කමිටු රැස්වීම්	12,750.00	2,500.00
	23,994,246.00	**29,445,032.00**

සටහන් 22.3 - ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු

ගොඩනැගිල්ල නඩත්තුව	535,191.00	2,448,433.00
කාර්යාල උපකරණ නඩත්තුව	2,196,186.00	2,164,406.00
මණ්ඩලයීය භූමිය නඩත්තුව	123,929.00	223,980.00
මෝටර් රථ නඩත්තුව	594,526.00	550,968.00
	3,449,832.00	**5,387,787.00**

සටහන් 22.4 - ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්

ක්ෂයවීම්	11,968,918.00	12,787,062.00
	11,968,918.00	**12,787,062.00**

සටහන් 22.5 - වෙනත් වියදම්

විගණන ගාස්තු	975,000.00	975,000.00
නීති ගාස්තු	-	188,156.00
විවිධ වියදම්	1,995.00	5,464.00
	976,995.00	**1,168,620.00**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත කිරීම් හා තත්‍ය වියදම් විස්තරය

විස්තරය	අනුමත සංශෝධිත අයවැය	තත්‍ය වියදම්	විචලනය	හේතුව
පුනරාවර්තන				
පුද්ගලික දීමනා	105,000,000.00	100,628,000.00	4,372,000.00	පුද්ගලික දීමනා සඳහා සත්‍ය වියදම සහ ප්‍රතිපාදන ලැබීම්
ගමන් වියදම්	750,000.00	122,000.00	628,000.00	කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ භාණ්ඩාගාරයේ පාලන වියදම් හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන්
සැපයීම් හා පාරිභෝජන	4,695,000.00	2,443,000.00	2,252,000.00	කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ භාණ්ඩාගාරයේ පාලන වියදම් හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන්
වෙනත් සේවා	36,157,000.00	22,589,000.00	13,568,000.00	කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ භාණ්ඩාගාරයේ පාලන වියදම් හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන්
පුස්තකාල සේවා	9,310,000.00	12,425,000.00	(3,115,000.00)	ප්‍රශස්ථ මට්ටමකි. කොවිඩ් 19 වසංගත තත්ත්වයේ හමුවේ වූවද අයවැයගත ප්‍රගතියට වඩා වැඩි සැබෑ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.
	161,512,000.00	**141,657,000.00**	**19,855,000.00**	
ප්‍රාග්ධන				
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	7,500,000.00	688,000.00	6,812,000.00	කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වූවද අවිනිශ්චිත තත්ත්වය-න් නිසා වර්ෂය තුළදී වැඩිදුරටත් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීය
පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම	2,500,000.00	1,431,000.00	1,069,000.00	කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වූවද අවිනිශ්චිත තත්ත්වය-න් නිසා වර්ෂය තුළදී වැඩිදුරටත් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීය
	10,000,000.00	**2,119,000.00**	**7,881,000.00**	

විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/NLDSB/2020/FA/04 මබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 පෙබරවාරි 27 දින

05 MAR 2024

සභාපති,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනය අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ ඒවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ. ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :- 01. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.

02. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/NLDSB/2020/FA/03 | ඔබගේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 පෙබරවාරි 27 දින

සභාපති,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. අභිතකර මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1998 අංක 51 දරන නව සංශෝධිත පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) මණ්ඩලයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංවිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නිත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග,

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

රු.113,791.583 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර නිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.2,119,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් හා විදේශ ප්‍රදාන රු.1,079,000 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයේදී රු.895,000 ක් වැයකර ලබාගෙන තිබූ අන්තර් ජාතික ප්‍රමිත පොත් අංක නිකුත් කිරීමේ පරිගණක මෘදුකාංග පද්ධතිය (ISBN) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 26 වගන්තිය අනුව අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) කෘමි පලිබෝධකයින් මර්ධනය කිරීමේ ක්‍රමවේදයට හිමි ජේටන්ට් බලපත්‍රය 2023 මැයි 09 දින මණ්ඩලයට භාරදී තිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 24 දින විගණනයට ඉදිරිපත් කිරීමේදී ශේෂපත්‍ර දිනෙන් පසු සිදුවීමක් ලෙස සලකා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 6 හි 11 (ආ) ඡේදය අනුව එම ජේටන්ට් බලපත්‍රය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලයේ කාර්යාලීය ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් 2021 දෙසැම්බර් 06 දින මණ්ඩලයට පවරා දී තිබුණ ද 1995 වර්ෂයේ දී එම ඉඩමේ රු.254,400,000 ක්වූ තක්සේරු වටිනාකම හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.219,763 ක් වූ ඉතිරිකිරීමේ බැංකු ගිණුම් ශේෂයේ නිවැරදිකාවය සනාථ කර ගැනීම සඳහා බැංකු පාස්පොත හෝ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(උ) මිලදී ගත් පොත් තොගයේ එකතු වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.113,791,583 ක් වුවද පරිග්‍රහණ ලේඛනය අනුව එම වටිනාකම රු.43,135,921 ක් වූයෙන් රු.70,655,662ක්වූ වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අලෙවිසැලේ වටිනාකම රු.264,303 ක් වූ පොත් 1,714 ක්ද වටිනාකම රු.452,972 ක් වූ මණ්ඩලීය ප්‍රකාශන හා වටිනාකම් සඳහන් නොවූ මණ්ඩලීය ප්‍රකාශන 10,746 ක්ද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට විකුණුම් හා බෙදාහැරීමේ පොත් තොගය මූල්‍ය ප්‍රකාශන අනුව පැවති ශේෂය තොග සමීක්ෂණ වාර්තා සමඟ සැසඳීමේදී රු.115,979 ක වෙනසක් පැවතුණි.

(ඒ) තැගි ඔප්පුවක් මඟින් 2019 ජූලි 19 වන දින මණ්ඩලය වෙත පවරා දී තිබූ බණ්ඩාරගම පිහිටි පර්චස් 12 ක ඉඩම හා මහල් දෙකකින් යුත් ගෘහ භාණ්ඩ සහිත නිවස 2021 මැයි 18 දින රු.11,406,800 කට තක්සේරු කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000 ක් පමණක් අනාවරණය කර තිබුණි. තවද එහි ඇතුළත් ගෘහ භාණ්ඩ හා රු.183,817 ක් වටිනා පුස්තකාල පොත් තොග ද ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2015 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රලේඛන සම්පත් සුචිකරණයේදී භාවිතාකරන පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතිය (KOHA) පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වය වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ අභිමතකර මතය සඳහා පදනම් කොටසේ (අ),(ඉ),(ඊ),(උ),(ඌ),(එ),(ඒ) හා (ඔ)

යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූලික ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
2020 අගෝස්තු 14 දිනැති අංක SC & PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු වක්‍රලේඛය	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමෙන් තොරව 2020 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති 2 කට අදාලව රු.15,689,163 (USD 82,500) ක් වූ විදේශ ප්‍රදාන ලබාගැනීමට ගිවිසුම්ගත වී තිබුණු අතර ඉන් ව්‍යාපෘතියක් සඳහා රු.2,117,953 ක මුදලක් ලබාගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලැබී තිබුණු රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.5,581,000 ක් උපයෝජනය කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.චිත්‍රමරත්න
විගණකාධිපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	විගණන නිරීක්ෂණය	පිළිතුර
1.2	අහිතකර මතය සඳහා පදනම	
(අ)	මණ්ඩලයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නීත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග රු. 113,791,583 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදා ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.	2023 ජනවාරි මාසයේ සිට ජාතික තැන්පතුවට එකතු වන සියලුම ප්‍රකාශන අගය කර ගිණුම්ගත කිරීමට හා අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. ජාතික පුස්තකාල එකතුවෙහි වටිනාකම හඳුනා ගැනීම යටතේ දැනට 2022 ඔක්තෝබර් මාසයේ සිට ජාතික පුස්තකාල එකතුවට අත්පත් කරගනු ලබන මිල සඳහන් නොවන ප්‍රකාශනවල මිල තීරණය කිරීම සිදු කරගෙන යනු ලබයි.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. 2,119,000ක් ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් හා විදේශ ප්‍රදාන රු. 1,079,000ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදු කර නොතිබුණි.	ප්‍රාග්ධන ප්‍රදාන හා විදේශ ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදු කළ යුතු ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11හි දක්වා ඇති ආකෘතිය අනුව අදාළ තොරතුරු 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	2020 වර්ෂයේ දී රු. 895,000ක් වැයකර ලබාගෙන තිබූ අන්තර් ජාතික ප්‍රමිත පොත් අංක නිකුත් කිරීමේ පරිගණක මෘදුකාංග පද්ධතිය (ISBN) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20හි 26 වගන්තිය අනුව අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	අන්තර් ජාතික ප්‍රමිත පොත් අංක නිකුත් කිරීමේ පරිගණක මෘදුකාංග පද්ධතිය, පරිගණක හා උපාංග යටතේ ගිණුම්ගත කර ඇත. එය නිවැරදි වර්ගීකරණය වන අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට 2022 මූල්‍ය ප්‍රකාශනය මගින් කටයුතු කරනු ලැබේ.
(ඈ)	කෘමි පළිබෝධකයින් මර්දනය කිරීමේ ක්‍රමවේදයට හිමි පේටන්ට් බලපත්‍රය 2023 මැයි 09 දින මණ්ඩලයට භාර දී තිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 24 දින විගණනයට ඉදිරිපත් කිරීමේදී ශේෂපත්‍ර දිනෙන් පසු සිදුවීමක් ලෙස සලකා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 6හි 11 (ආ) ඡේදය අනුව එම පේටන්ට් බලපත්‍රය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	කෘමි පළිබෝධකයින් මර්දනය කිරීමේ ක්‍රමවේදයට හිමි පේටන්ට් බලපත්‍රය පිළිබඳ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ)	මණ්ඩලයේ කාර්යාලයීය ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් 2021 දෙසැම්බර් 06 දින මණ්ඩලයට පවරා දී තිබුණ ද 1995 වර්ෂයේ දී එම ඉඩමේ රු.254,400,000ක් වූ තක්සේරු වටිනාකම හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	1995 වර්ෂයේ දී මෙම ඉඩම තක්සේරු කළ ද ඒ පිළිබඳ ව ලිඛිත සාක්ෂියක් නොමැතිවීම හේතුවෙන් 2020, 2021 යන වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොකළ අතර 2023.08.15 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මෙම ඉඩම සඳහා රු.6,392,100,000.00ක වටිනාකමක් තක්සේරු කර ඇති අතර ඒ පිළිබඳව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමටත්, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීමටත් කටයුතු කරනු ලැබේ.
(ඊ)	මූල්‍ය ප්‍රකාශන අනුව රු. 219,763.00ක් වූ ඉතිරි කිරීමේ බැංකු ගිණුම් ශේෂයේ නිවැරදිතාවය සනාථ කර ගැනීම සඳහා බැංකු පාස්පොත හෝ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.	වසර ගණනාවක් තිස්සේ ගනුදෙනු කිසිවක් මෙම ගිණුම හරහා සිදු නොවුණු බැවින් මෙම ගිණුම අත්හිටුවා ඇති අතර මෙම ගිණුම සක්‍රිය ගිණුමක් බවට පත් කර ඒ සඳහා ශේෂ සනාථන සහතිකයක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
(උ)	මිලදී ගත් පොත් තොගයේ එකතු වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු. 113,791,583ක් වුව ද පරිග්‍රහණ ලේඛනය අනුව එම වටිනාකම රු.43,135,921ක් වූයෙන් රු. 70,655,662ක් වූ වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ, පිරියත හා උපකරණ යටතේ පොත් තොගයේ පිරිවැය සහ පරිග්‍රහණ ලේඛනය අනුව පොත් තොග යේ පිරිවැය අතර රු.70,655,662.00ක වෙනස හඳුනාගැනීම සඳහා මේ වන විට කටයුතු කරගෙන යමින් පවතී. ඒ අනුව Koha දත්ත පද්ධතියට ඇතුළත් කර නොමැති ප්‍රකාශන හඳුනාගෙන එම ප්‍රකාශන Koha දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා නව ව්‍යාපෘති යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී.
(ඌ)	2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අලෙවිසැලේ වටිනාකම රු. 264,303ක් වූ පොත් 1,714ක් ද වටිනාකම රු. 452,972ක් වූ මණ්ඩලයීය ප්‍රකාශන හා වටිනාකම සඳහන් නොවූ මණ්ඩලයීය ප්‍රකාශන 10,746ක් ද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධ අවශ්‍ය ගිණුම්කරණ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
(එ)	2021 දෙසැම්බර් 31 දිනට විකුණුම් හා බෙදාහැරීමේ පොත් තොගය මූල්‍ය ප්‍රකාශන අනුව පැවති ශේෂය තොග සමීක්ෂණ වාර්තා සමඟ සැසඳීමේ දී රු. 115,979ක වෙනසක් පැවතුණි.	මෙම තොග වෙනස පිළිබඳව පරීක්ෂා කර එම වෙනස ශූන්‍ය කිරීමට 2022 වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ.

(ඒ)	තෑගි ඔප්පුවක් මගින් 2019 ජූලි 19 වන දින මණ්ඩලය වෙත පවරා දී තිබූ බණ්ඩාරගම පිහිටි පර්චස් 12ක ඉඩම හා මහල් දෙකකින් යුත් ගෘහ භාණ්ඩ සහිත නිවස 2021 මැයි 18 දින රු.11,406,808කට තක්සේරු කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000ක් පමණක් අනාවරණය කර තිබුණි. තවද එහි ඇතුළත් ගෘහ භාණ්ඩ හා රු.183,817ක් වටිනා පුස්තකාල පොත් තොග ද ගිණුම්ගත කර නොතිබුණි.	මෙම ඉඩම හා මහල් දෙකකින් යුත් ගෘහභාණ්ඩ සහිත නිවසේ වටිනාකම 2022 මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. රු.183,817ක් වටිනා පුස්තකාල පොත් තොගය 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඔ)	2015 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රලේඛන සම්පත් සුචිකරණයේ දී භාවිතාකරන පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතිය (Koha) පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	Koha පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතිය විවෘත කේත (Open source) මෘදුකාංගයක් වන අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට 2022 වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ.
2.2.2	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබා ගැනීමෙන් තොරව 2020 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති 2කට අදාළව රු. 15,689,163 (USD 82,500)ක් වූ විදේශ ප්‍රදාන ලබා ගැනීමට ගිවිසුම්ගත වී තිබුණු අතර ඉන් ව්‍යාපෘතියක් සඳහා රු. 2,117,953ක මුදලක් ලබාගෙන තිබුණි.	මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම විදේශ ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබා ගැනීමට වාර්තාවක් සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
2.3	වෙනත් කරුණු සමලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය වෙත ලැබී තිබුණු රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු. 5,581,000ක් උපයෝජනය කර නොතිබුණි.	2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ ද COVID – 19 වසංගත රෝග තත්වය හා රට තුළ පැවති නිරෝධායන නීතිරීති මත එම කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වූ බැවින් ගෙවීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය. එබැවින් මෙම මුදල උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.

පරිච්ඡේදය 04

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු

පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.

ආයතනය මඟින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සහ ව්‍යාපෘති මූලිකවම ඉහත සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක (4) යටතේ ක්‍රියාත්මක වේ.

4.2 තිරසර සංවර්ධන අරමුණුවල ජයග්‍රහණ සහ අභියෝගය

කාර්යය / වැඩසටහන ව්‍යාපෘතිය	මූල්‍ය ප්‍රභවය	අදාළ වන තිරසර සංවර්ධන-ඉලක්ක
ග්‍රන්ථ විඥාපන පාලන අංශය ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කිරීම. ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව ප්‍රකාශයට පත්කිරීම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
ප්‍රතිග්‍රහණ අංශය සියලුම ජන කොටස්වලට භාවිතය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත පුස්තකාල සහ ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් පවත්වාගෙන යාම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය ජාතික පුස්තකාලය සතු ලේඛන උරුමය සංරක්ෂණය කිරීම හා ශ්‍රී ලංකාවේ පුස්තකාල සතු පුස්තකාල සම්පත් සංරක්ෂණය වෙනුවෙන් මගපෙන්වීම මඟින් දේශයේ අධ්‍යාපනයෙහි ගුණාත්මක සංවර්ධනයට දායක වීම. UNESCO Memory of the World සහ UNESCO Intangible Cultural Heritage ව්‍යාපෘති මඟින් සංස්කෘතික උරුමයන් සංරක්ෂණයට දායක වීම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
ඩිජිටල් පුස්තකාල ඒකකය ජාතික පුස්තකාලය සතු පැරණි ගැසට් එකතුව ඩිජිටල්කරණය කිරීම.(1956 ඔක්තෝබර් සිට 1975 අප්‍රේල් මාසය දක්වා)	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4

ප්‍රකාශන අංශය ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය නව ප්‍රකාශන මිලදී ගැනීමේ ව්‍යාපෘතිය ග්‍රන්ථ පරිවර්ථන ව්‍යාපෘතිය රටක් වටින පොතක් ව්‍යාපෘතිය.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
පර්යේෂණ අංශය තෝරාගත් කාලීන මාතෘකා යටතේ පර්යේෂණ පැවැත්වීම. පුස්තකාල විද්‍යාව ක්ෂේත්‍රයේ පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
පාඨක සේවා අංශය සියලුම ජන කොටස්වල භාවිතය සඳහා, ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත පුස්තකාල සහ ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ගොඩනැගීම. පාඨක අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම. විවිධ විෂය ක්ෂේත්‍රවල විද්වතුන් සම්බන්ධ කර ගනිමින් විවිධ තේමා ඔස්සේ කාලීන දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. (Meet and Expert සහ Let's Read වැඩසටහන්) ජාතික පුස්තකාල එකතුවේ සංවර්ධනය හා සංවිධානාත්මක කටයුතු සිදු කිරීම. මණ්ඩලයීය නවීකරණ කටයුතුවලට අදාළ කාර්යයන් සිදු කිරීම. පුස්තකාල සම්පත්වල සංරක්ෂණය සහ ආරක්ෂාව	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4

අධ්‍යාපන හා පුහුණු අංශය මහජන, පාසල් සහ වෙනත් පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීම. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) මූල්‍ය අනුග්‍රහය යටතේ තෝරාගත් දිස්ත්‍රික්කවල පුස්තකාල ස්වයංක්‍රීයකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4
ගාස්තු අය කිරීමකින් තොරව Skills online Sri Lanka ව්‍යාපෘතිය යටතේ විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාළ කෙටි කාලීන පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දීම.	පොදු රාජ්‍ය ඉගෙනුම් සංගමය (COL) සහ මණ්ඩලයීය ප්‍රතිපාදන	
ව්‍යාප්ති සේවා අංශය කියවීම දිරි ගැන්වීම සඳහා පුස්තකාල වෙත පොත් පරිත්‍යාග ලබා දීම. පොතපත කියවීම ප්‍රවර්ධනය උදෙසා කියවීමේ කඳ-වුරු සංවිධානය කිරීම. ජාතික වශයෙන් කියවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් සෑම වසරක ම ජාතික කියවීම් මාසය වැඩසටහන සංවිධානය කිරීම. රට තුළ ඉහළ ප්‍රමිතියකින් යුත් පුස්තකාල පද්ධතියක් ගොඩනැඟීම සඳහා පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම.	මහා භාණ්ඩාගාරය සහ ආයතනික ඉපයීම් මඟින්	4

පරිච්ඡේදය 05

මානව සම්පත් පැතිකඩ

5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු /අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	21	17	04
තෘතීයික	20	12	08
ද්විතීයික	101	68	33
ප්‍රාථමික	55	42	13
මුළු ගණන	197	139	58

5.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපෑම

සේවක පුරප්පාඩු පැවතීම හේතුවෙන් වාර්ෂික සැලැස්ම අනුව ඒ ඒ අංශ විසින් ඉටු කළ යුතු රාජකාරි ඉටු කිරීමට බාධා පැමිණීම.

5.3 මානව සම්පත් සංවර්ධනය

පුහුණු සැලැස්ම - 2021

පුහුණුව/සම්මන්ත්‍රණය/ වැඩමුළුව	සහභාගී වූ නිලධාරීන්	ස්ථානය	කාලය /දිනය
අනුක්‍රමණිකාකරණය හා විෂය ශීර්ෂ සම්පාදනය පිළිබඳ වැඩමුළුව	ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය	ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය	2021.02.23
ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය	ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය	2021.03.26
තිරසර සංවර්ධනය ආයතනික කටයුතු සඳහා -යොමුකර ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන	ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය	ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය	2021.04.01
සූචිකරණය හා MARC 21 ආකෘතිය පිළිබඳ මාර්ගගත පුහුණුව	ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය	මාර්ගගත	2021.09.28



ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07.

ஆண்டறிக்கை

2021